22601
26 MAY 2009
LIBRARY & INFORMATION CENTRE
Sri Lanka
Publications Department

# II. 1965 ආර්ථික හා මූල්‍ය හැඩගැස්ම

## (අ) ජාතික නිෂ්පාදිතය සහ වියදම

**හැඳින්වීම**

පවත්නා සාධක වියදම් මිල අනුව, 1965 දී ලංකාවේ දළ ජාතික නිෂ්පාදිතය රුපියල් කෝටි 738.8 ක් වේ යැයි තාවකාලික වශයෙන් ඇස්තමේන්තු කර ඇත. 1964 දී මේ පිළිබඳ ප්‍රතිශෝධිත ඇස්තමේන්තුව රුපියල් කෝටි 710.4 ක් වූයේය. 1964 දී සියයට 5.8 ක් වූ වැඩිවීමේ අනුපාතිකයත් සමග සසඳන කල 1965 දී වැඩි වීමේ අනුපාතිකය සියයට 4.0 ක් විය. 1965 දී අපනයන අංශයේ හා දේශීය අංශයේ ශුද්ධ නිමැවුමේ වටිනාකම ප්‍රාසාරණය වීමේ වේගය ඉකුත් වර්ෂයේදී තරම් විශාල නොවීය. තේ හා රබර් අපනයන වටිනාකම වැඩි වූ නමුදු පොල් නිමැවුම පහළ වැටීම හේතුකොට ගෙන පොල් නිෂ්පාදිත අපනයන පහළ වැටුණේය. මේ සමගම අපනයන තොගයන්ද පහළ වැටීම හේතු කොට ගෙන දළ ජාතික නිෂ්පාදිතයට අපනයන අංශයෙන් ලැබෙන කොටස වැඩිවූයේ සියයට 2.2 කින් පමණෙකි. ඉකුත් වර්ෂයේදී එහි වැඩිවීම සියයට 5.4 ක් වූයේය. අයහපත් කාලගුණය හේතු කොට ගෙන දේශීය අංශයේ (ශුද්ධ) වී නිෂ්පාදනය සියයට 31·2 කින් පහළ වැටුනේය. එසේ වුවද, ප්‍රධාන වශයෙන්ම මාළු, පශු හා කාර්මික නිෂ්පාදන, වාණිජ, ප්‍රවාහන හා රාජ්‍ය සේවාවන් ඇතුළු අනෙකුත් භාණ්ඩ හා සේවාවන්හි ශුද්ධ නිමැවුම් වටිනාකම නොකඩවා වැඩිවීම හේතු කොට ගෙන දේශීය අංශයේ (ශුද්ධ) නිමැවුමේ වටිනාකම සියයට 4.1 කින් ඉහළ ගියේය. 1964 දී එහි වැඩිවීම සියයට 5·5ක් විය.

මූර්ත නිෂ්පාදිතය, එනම් ස්ථාවර* මිල අනුව දළ ජාතික නිෂ්පාදිතය 1964 සංශෝධිත සංඛ්‍යාව වූ රුපියල් කෝටි 688.8 හි සිට 1965 දී රුපියල් කෝටි 702.4 දක්වා සියයට 2.0 කින් වැඩි විය. ඉකුත් වර්ෂයේදී එය සියයට 4.4 කින් වැඩිවී ඇත. 1964 දී සියයට 6.4 කින් වැඩි වූ අපනයන අංශයේ ශුද්ධ නිමැවුමෙහි වටිනාකම 1965 දී සියයට 0.8 කින් පහළ වැටුන අතර ඉකුත් වර්ෂයේදී සියයට 3.3 කින් වැඩි වූ දේශීය අංශයේ ශුද්ධ නිමැවුමෙහි වටිනාකම 1965 දී සියයට 2.5 කින් වැඩිවිය.

තාවකාලික ඇස්තමේන්තු අනුව, 1965 වර්ෂයේදී ජනගහණය වැඩිවීමේ වේගය 1964 වේගය වූ සියයට 2.4ට සමාන විය. ජනගහණය වැඩිවීම ගණනට ගත් විට, ඒක ජන දළ ජාතික නිෂ්පාදිතය පවත්නා මිල අනුව සියයට 1.7 කින් වැඩිවී ඇති අතර ස්ථාවර මිල අනුව සියයට 0 4 කින් අඩුවී ඇත.

1964 දී වෙළෙඳ අනුපාතය සියයට 2.6 කින් පිරිහුන නමුදු 1965 දී එහි සියයට 1.2 ක වර්ධනයක් දක්නට ලැබුණි. මේ හේතු කොට ගෙන මූර්ත ජාතික ආදායම සියයට 2.2 කින්, එනම් සියයට 2.0 ක් වූ මූර්ත නිෂ්පාදිතයේ වැඩිවීම් අනුපාතිකයටත්, ඉහළ අනුපාතිකයකින්, වැඩිවිය.

පවත්නා වෙළඳ මිල අනුව 1965 දී දළ ජාතික වියදම මඳ වශයෙන් වැඩි වූ බවක් පෙනී විණ. 1965 දී පෞද්ගලික පාරිභෝජන වියදම සුළු වශයෙන් වැඩිවූ නමුදු පෞද්ගලික අංශයේ හා රජයේ සංස්ථාවල ප්‍රාග්ධන සම්පාදනය පහත වැටිණි. එසේ වුවද, රාජ්‍ය අංශයේ පරිභෝජනය සුළු අනුපාතිකයකින් වුව වැඩිවෙමින් පැවතුන නමුදු, ඉකුත් වර්ෂයේදී පහළ වැටී තිබූ ප්‍රාග්ධන සම්පාදනය, මෙම වර්ෂයේදී සැලකිය යුතු ප්‍රමාණයකින් ඉහළ ගියේය. මෙම වෙනස්වීම් වල ප්‍රතිඵලයක් වශයෙන් 1965 දී මුළු දළ ජාතික වියදම සියයට 3.2 කින් ඉහළ ගියේය. 1964 දී එය සියයට 7.2 කින් ඉහළ ගොස් තිබිණි.

* 1959 මිල

## සංඛ්‍යා සටහන II (අ) 1

## නිෂ්පාදනය හා වියදම පිළිබඳ දර්ශක සාරාංශය

| | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1965 |
|---|---|---|---|---|---|---|---|
| **අ. වටිනාකම** | | | | | | | |
| (1) දළ ජාතික නිෂ්පාදිතය-සාධක වියදම් මිල අනුව (රුපියල් දශ ලක්ෂ) .. .. .. | 5,854 | 6,080 | 6,142 | 6,418 | 6,716 | 7,104 | 7,388 |
| (2) දළ දේශීය වියදම-වෙළෙඳ මිළ අනුව (රුපියල් දශ ලක්ෂ) .. ,. .. | 6,613 | 6,817 | 6,813 | 7,009 | 7,179 | 7,702 | 7,732 |
| (3) පෞද්ගලික පාරිභෝජනය-වෙළෙඳ මිළ අනුව (රුපියල් දශ ලක්ෂ) .. .. .. | 4,673 | 4,985 | 4,840 | 4,999 | 5,170 | 5,629 | 5,692 |
| (4) රජයේ පාරිභෝජනය-වෙළෙඳ මීළ අනුව (රුපියල් දශ ලක්ෂ) .. .. .. | 881 | 911 | 926 | 979 | 1,011 | 1,090 | 1,116 |
| (5) දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය වෙළෙඳ මිළ අනුව (රුපියල් දශ ලක්ෂ) .. .. .. | 1,069 | 966 | 978 | 1,031 | 991 | 1,023 | 969 |
| (6) භාණ්ඩ අපනයන (අ) සහ සාධක නොවන සේවා (රුපියල් දශ ලක්ෂ) .. .. .. | 2,016 | 2,011 | 1,907 | 1,971 | 1,903 | 1,937 | 2,081 |
| (7) භාණ්ඩ ආනයන (අ) සහ සාධක නොවන සේවා (රුපියල් දශ ලක්ෂ) .. .. .. | 2,176 | 2,209 | 1,972 | 2,070 | 2,031 | 2,102 | 2,058 |
| (8) දළ ජාතික නිෂ්පාදිතය-ප්‍රතිශීර්ෂ වශයෙන් (ඇ) සාධක මිල අනුව (රුපියල් දශ ලක්ෂ) .. | 608 | 614 | 604 | 615 | 627 | 647 | 658 |
| (9) දළ දේශීය වියදම් ප්‍රති ශීර්ෂ වශයෙන් (රුපියල්) .. .. .. | 687 | 689 | 670 | 671 | 670 | 702 | 688 |
| (10) දළ ජාතික නිෂ්පාදිතය 1959 සාධක වියදම් මිල අනුව (රුපියල් දශ ලක්ෂ) .. .. .. | 5,854 | 6,066 | 6,240 | 6,472 | 6,599 | 6,888 | 7,024 |
| (11) දළ ජාතික නිෂ්පාදිතය ප්‍රතිශීර්ෂ වශයෙන් (ඇ) 1959 සාධක වියදම් මිල අනුව (රුපියල්) .. | 608 | 613 | 614 | 620 | 616 | 628 | 625 |
| **ආ. දර්ශක අංක (1959=100·0)** | | | | | | | |
| (1) දළ ජාතික නිෂ්පාදිතය-සාධක වියදම් මිල අනුව .. | 100·0 | 103·9 | 104·9 | 109·6 | 114·7 | 121·3 | 126·2 |
| (2) දළ දේශීය වියදම්-වෙළෙඳ මිල අනුව .. .. | 100·0 | 103·1 | 103·0 | 106·0 | 108·6 | 116·5 | 116·9 |
| (3) පෞද්ගලික පාරිභෝජනය-වෙළෙඳ මිළ අනුව .. | 100·0 | 106·7 | 103·6 | 107·0 | 110·6 | 120·5 | 121·8 |
| (4) රජයේ පාරිභෝජනය-වෙළෙඳ මිළ අනුව .. .. | 100·0 | 103·4 | 105·1 | 111·1 | 114·7 | 123·7 | 126·7 |
| (5) දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය වෙළෙඳ මිල අනුව | 100·0 | 90·4 | 91·5 | 96·5 | 92·7 | 95·7 | 90·7 |
| (6) භාණ්ඩ අපනයන (අ) සහ සාධක නොවන සේවා .. | 100·0 | 99·7 | 94·6 | 97·8 | 94·4 | 96·1 | 103·2 |
| (7) භාණ්ඩ ආනයනය-(ආ) සහ සාධක නොවන සේවා .. .. .. | 100·0 | 101·5 | 90·6 | 95·1 | 93·3 | 96·6 | 94·6 |
| (8) දළ ජාතික නිෂ්පාදිතය-ප්‍රතිශීර්ෂ වශයෙන් (ඇ) සාධක මිල අනුව .. .. | 100·0 | 101·0 | 99·3 | 101·0 | 103·1 | 106·4 | 108·2 |
| (9) දළ දේශීය වියදම්-ප්‍රතිශීර්ෂ වශයෙන් (ඇ) .. .. | 100·0 | 100·3 | 97·5 | 97·7 | 97·6 | 102·2 | 100·2 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

(අ) අපනයන කළ වෙළෙඳ භාණ්ඩ– නැ. වි. ස. මිල–වටිනාකම

(ආ) ආනයන කළ වෙළෙඳ භාණ්ඩ– මි. ර. ගැ.–වටිනාකම

(ඇ) පහත සඳහන් ජන ඇස්තමේන්තු උපයෝගී කොටගෙන ඇත.

| | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1965 |
|---|---|---|---|---|---|---|---|
| මැදි අවුරුදු ජනගහනය | 9,625,000 | 9,896,000 | 10,168 000 | 10.443,000 | 10,712,000 | 10 971,000 | 11,232,000 |
| දර්ශක අංක | 100.0 | 102.8 | 105.6 | 108.5 | 111.3 | 114.0 | 116.7 |

### නිෂ්පාදනය හා වියදම මුදලින්

දළ ජාතික නිෂ්පාදිතය සහ එහි සැකැසුම පවත්නා සාධක වියදම් මිල අනුව II (අ) 2 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. 1965 දී අපනයන සඳහා නිෂ්පාදනය දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 21 ක් පමණ වූයේ 1964 දීට වඩා සුළු වර්ධනයක් පිළිබිඹු කරමිණි. තේ සහ රබර් අපනයන වටිනාකම පිළිවෙලින් සියයට 6.0 කින් සහ සියයට 4.9 කින් ඉහළ ගියේය. අපනයන මිල දර්ශකයෙන් පිළිපිඹු වූ පරිදි තේ වල නැ.වි.ස. මිල සියයට 2.4 කින් පහත වැටී තිබුන නමුත් අපනයනය කළ තේ ප්‍රමාණය සියයට 8.5 කින් වැඩිවිය. රබර් අපනයන පිළිබඳව ද සමාන උපනතියක් දක්නට ලැබිණි. රබර් අපනයන පරිමාව සියයට 6.4 කින් ඉහළ ගිය අතර සාමාන්‍ය නැ.වි.ස. මිල සියයට 0.4 කින් පහළ වැටුනේය. එසේ වුවද 1964 දී

## දළ-ජාතික නිෂ්පාදිතය-පවත්නා සාධක වියදම් මිල අනුව

| | රුපියල් දශ ලක්ෂ | | | | | | | වෙනසෙහි සියයට ගණන | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1965 | 1960/59 | 1961/60 | 1962/61 | 1963/62 | 1964/63 | 1965/64 |
| I. ආනයන සඳහා නිෂ්පාදනය | | | | | | | | | | | | | |
| (i) දේශීය අපනයනය නැ. වි. ස. වටිනාකම .. | 1,692 | 1,775 | 1,681 | 1,766 | 1,705 | 1,842 | 1,916 | + 4·9 | — 5·3 | + 5·1 | — 3·5 | + 8·1 | + 4·0 |
| තොග වෙනස්වීමේ වටිනාකම .. .. | — 2 | — 39 | + 15 | — 34 | + 3 | — 36 | — 75 | | | | | | |
| පාවිච්චි කළ ආනයන භාණ්ඩ හැර (වෙළෙඳ වටිනාකම) .. .. .. | —124 | —120 | —135 | —151 | —160 | —173 | —171 | | | | | | |
| අපනයන කැරුනු භාණ්ඩ බෙදාහැරීමේ වියදම් හැර | —104 | —109 | —114 | —123 | —119 | —128 | —132 | | | | | | |
| නිපැයුම (ශුද්ධ) .. .. .. .. | 1,462 | 1,507 | 1,447 | 1,458 | 1,429 | 1,506 | 1,539 | + 3·0 | — 4·0 | + 0·8 | — 2·0 | + 5·4 | + 2·2 |
| (ii) ප්‍රති අපනයන: එකතු කළ වටිනාකම .. | 3 | 2 | 2 | 2 | 1 | 1 | 1 | | | | | | |
| අපනයන සඳහා කැරුනු මුළු නිෂ්පාදනය: නිපැයුම (ශුද්ධ) .. .. .. .. .. | 1,465 | 1,509 | 1,449 | 1,460 | 1,430 | 1,507 | 1,540 | + 3·0 | — 3·9 | + 0·7 | — 2·0 | + 5·4 | + 2·2 |
| II. දේශීය පාවිච්චිය සඳහා නිෂ්පාදනය (නිපැයුම ශුද්ධ) | | | | | | | | | | | | | |
| (i) කෘෂිකර්මය, දුව ඇ වන ද්‍රව්‍ය, පශු සම්පත හා ධීවර කර්මාන්තය .. .. .. | 1,276 | 1,341 | 1,385 | 1,426 | 1,531 | 1,586 | 1,506 | + 5·1 | + 3·3 | + 2·9 | + 7·3 | + 3·6 | — 5·0 |
| (ii) කර්මාන්ත අන්තැනක නොසඳහන් .. .. | 255 | 305 | 342 | 406 | 484 | 533 | 590 | +19·3 | +12·1 | +19·0 | +19·1 | +10·0 | +10·8 |
| (iii) ප්‍රාග්ධන සංවර්ධනය (භාණ්ඩ හා සේවා) | | | | | | | | | | | | | |
| (අ) රජය .. .. .. .. | 139 | 146 | 193 | 204 | 200 | 188 | 214 | —22·4 | +31·6 | + 5·7 | — 1·6 | — 6·0 | +13·5 |
| (ආ) රජයේ ව්‍යාපාර .. .. .. | 55 | 61 | 65 | 86 | 107 | 86 | 109 | +11·5 | + 6·4 | +31·1 | +25·5 | —20·1 | +27·0 |
| (ඇ) පෞද්ගලික අංශය හා රජයේ සමායතන | 265 | 259 | 252 | 270 | 253 | 284 | 280 | — 2·2 | — 2·9 | + 7·2 | — 6·3 | +12·5 | — 1·5 |
| (iv) ප්‍රවාහණය හා පණිවුඩ හුවමාරුව (රජයේ නොවන) .. .. .. .. | 450 | 493 | 476 | 500 | 522 | 587 | 647 | + 9·7 | — 3·4 | + 5·0 | + 4·4 | +12·4 | +10·2 |
| (v) වෙළෙඳාම (රජයේ නොවන)* .. .. | 628 | 633 | 608 | 643 | 707 | 754 | 837 | + 0·7 | — 4·0 | + 5·9 | + 9·9 | + 6·6 | +11·0 |
| (vi) නිවාස අයිතිය .. .. .. | 169 | 178 | 196 | 205 | 223 | 238 | 254 | + 5·9 | + 9·9 | + 4·5 | + 8·9 | + 6·6 | + 6·6 |
| (vii) රජයේ: අන් තැනක නොසඳහන් .. .. | 702 | 755 | 759 | 792 | 821 | 869 | 902 | + 7·6 | + 0·6 | + 4·3 | + 3·7 | + 5·9 | + 3·7 |
| (viii) සේවා: අන් තැනක නොසඳහන් .. .. | 438 | 445 | 457 | 474 | 491 | 508 | 526 | + 1·5 | + 2·8 | + 3·5 | + 3·7 | + 3·4 | + 3·5 |
| එකතුව | 4,426 | 4,616 | 4,733 | 5,005 | 5,339 | 5,633 | 5,864 | + 4·3 | + 2·5 | + 5·7 | + 6·7 | + 5·5 | + 4·1 |
| **III. දළ-ජාතික නිෂ්පාදිත** .. | 5,891 | 6,124 | 6,182 | 6,464 | 6,769 | 7,140 | 7,404 | + 4·0 | + 0·9 | + 4·6 | + 4·7 | + 5·5 | + 3·7 |
| **IV. පිටරටින් ලැබූ සාධක ආදායම් (ශුද්ධ)** | — 37 | — 44 | — 40 | — 47 | — 53 | — 36 | — 15 | | | | | | |
| **V. දළ ජාතික නිෂ්පාදිතය** .. | 5,854 | 6,080 | 6,142 | 6,418 | 6,716 | 7,104 | 7,388 | + 3·9 | + 1·0 | + 4·5 | + 4·7 | + 5·8 | + 4·0 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

ශීර්ෂ විග්‍රහය:

1. රජයට යන්නට, ශීර්ෂ (III) (අ) II (VII) මහ ආණ්ඩුව සහ පලාත් පාලන ආණ්ඩු අයත් වෙයි. එහෙත්, රජයේ සමායතන හා රජයේ ව්‍යාපාර (දුම්රිය, විදුලි, වැඩ, වරාය කොමිසම, තැපැල් හා තැපැල් පණිවුඩ සහ ලුණු දෙපාර්තමේන්තුව) ඇතුලත් නොවේ. 2. ශීර්ෂ II (VII) (රජයේ අන් තැනෙක නොසඳහන්) ට, රජයේ ගොඩනැගිලිවල ආරෝපිත කුලිය ඇතුලත් වෙයි. 3. රාජ්‍ය අංශයේ ශුද්ධ ප්‍රාග්ධන සංවර්ධන නිපැයුමට (ශුද්ධ) (ශීර්ෂ 2 (III (අ) පහත ශීර්ෂ ඇතුලත් වෙයි. (අ) කොන්ත්‍රාත් පිට කැරුන රජයේ ප්‍රාග්ධන වැඩවල (ශුද්ධ) නිපැයුම සහ (ආ) ප්‍රාග්ධන සංවර්ධනයේදී කරන ලද අවශේෂ සේවා–උදා: රජයේ ආනයනය කැරුනු ප්‍රාග්ධන භාණ්ඩ ප්‍රවාහණය. 4. පෞද්ගලික අංශයේ සහ රජයේ සමායතන වල ප්‍රාග්ධන සංවර්ධනයේ (ශුද්ධ) නිපැයුමට (ශීර්ෂ 2 (III) (ඇ) පහත සඳහන් ශීර්ෂ ගැනේ. (අ) ගොඩනැගිලි කර්මාන්තවල (ශුද්ධ) නිපැයුම. (ආ) දේශීය ප්‍රයෝජනය සඳහා ගොඩ නැගිලි උපකරණ සහ අනෙකුත් ප්‍රාග්ධන භාණ්ඩ, නිපදවන කර්මාන්තයන්ගේ ශුද්ධ නිපැයුම සහ (ඇ) වගාවේ සහ නැවත වගාවේ ශුද්ධ නිපැයුම. 5. ශීර්ෂ 2 (IV) ට (ප්‍රවාහණය සහ පණිවුඩ හුවමාරුව (රජයේ නොවන) සහ ශීර්ෂ 2 ට (වෙළෙඳම රජයේ නොවන) මේ අංශයේ ක්‍රියාත්මක වන රජයේ ව්‍යාපාර ගැනේ. අපනයන අංශය සඳහා දරන ලද සේවාවන්ද මේ ශීර්ෂ වලට ඇතුලත් වෙයි. පළින් පල පිරික්සීමෙන් නිගමනය කැරෙන ප්‍රවාහණ ගාස්තු හා වෙළෙඳ ආන්තිකය වැඩිවීම ගණන් ගැණෙන සේ වෙළෙඳ හා ප්‍රවාහණ ඇස්තමේන්තු ප්‍රතිශෝධනය. 6. ශීර්ෂ 11 (I) කෘෂිකර්මය, දුව ඇ වන ද්‍රව්‍ය, පශු සම්පත් සහ ධීවර කර්මාන්තය මෙම ශීර්ෂයට ඇතුළත් කර ඇති තේ හා පොල් සඳහා ඇස්තමේන්තු සකස්කර ඇත්තේ ඒකජන පාරිභෝජනය පිළිබඳ සංඛ්‍යා තොරතුරු පදනම් කරගෙනය. 1959 සිට 1962 දක්වාවූ වර්ෂ සඳහා ඇස්තමේන්තු සකස් කිරීම සඳහා 1953 පාරිභෝගික අයවැය සමීක්ෂණයෙන් සංඛ්‍යා තොරතුරු ලබා ගන්නා ලද, අතර, 1963 සහ 1964 සඳහා ඇස්තමේන්තු සකස් කිරීම සඳහා 1963 පාරිභෝගික අය වැය සමීක්ෂණයෙන් සංඛ්‍යා තොරතුරු ලබාගන්නා ලදී. මේ අනුව, 1963 සහ 1964 සඳහාවූ ඇස්තමේන්තු ඊට පෙර වර්ෂවල ඇස්තමේන්තු සමඟ කොහෙත්ම සැසඳෙන්නේ නොවේ.

පොදු සටහන්:

1. පළකර ඇති සංඛ්‍යාද, (ලංකා රේගු වාර්තාවෙන්) සමහර නියමිත ශීර්ෂ සඳහා සංඛ්‍යා ගත් විශේෂ වාර්තාද එනම්, කර්මාන්ත හා කර්මාන්ත නිපැයුම් දෙපාර්තමේන්තුව හැර මේ සංඛ්‍යා සටහනද දළ ජාතික වියදම් පිළිබඳ සටහනද සාද ගැනීමට අවශ්‍යවූ මූලික සංඛ්‍යා තොරතුරුවලින් වැඩිකොටසක් සංගණන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් කරුණා පෙරදැරිව සපයා ඇත. 2. සටහන්වල සංඛ්‍යා ලඟම දශමස්ථානයට ගෙන ඊම නිසා ශීර්ෂ එකතු මුළු එකතු වලින් වෙනස් විය හැකිය. 3. සංඛ්‍යා සටහන්වල වෙනස්වීමේ සියයට ගණන සකසා ඇත්තේ වටිනාකම රුපියල් දශ ලක්ෂවලින් මුල් දශමස්ථානයට ගෙන ඊමෙනි, 4. අ. නො.— අන් තැනෙක නොසඳහන්. 5. 1965 සඳහාවූ ඇස්තමේන්තු තාවකාලිකය

සංඛ්‍යා සටහන II (අ) 3

## දේශීය පාරිභෝජනය සඳහා මෙරට නිපද වූ භාණ්ඩ – පවත්නා නිෂ්පාදක මිල අනුව

| | රුපියල් දශ ලක්ෂ | | | | | | | වෙනසෙහි සියයට ගණන | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1965 | 1960න් 1959 ට | 1961න් 1960 ට | 1962න් 1961 ට | 1963න් 1962 ට | 1964න් 1963 ට | 1965න් 1964 ට |
| **1. කෘෂිකර්මය, දුව ඇවන ද්‍රව්‍ය, පශු සම්පත හා ධීවර කර්මාන්තය** | | | | | | | | | | | | | |
| හාල් .. .. .. | 400 | 472 | 475 | 524 | 534 | 544 | 382 | + 18·2 | + 0·6 | + 10·4 | + 1·8 | + 1·8 | — 29·8 |
| පොල් හා පොල් නිෂ්පාදිත * .. .. | 208 | 168 | 147 | 135 | 179 | 187 | 209 | — 19·4 | — 12·2 | — 8·2 | + 32·1 | + 4·8 | + 11·8 |
| තේ * .. .. .. | 54 | 56 | 56 | 55 | 60 | 62 | 66 | + 4·3 | ... | — 1·8 | + 10·0 | + 2·3 | + 6·8 |
| අනෙකුත් ආහාර භෝග .. .. | 327 | 350 | 382 | 382 | 390 | 411 | 423 | + 7·1 | + 9·3 | ... | + 2·1 | + 5·4 | + 2·9 |
| දුම්කොළ .. .. .. | 14 | 15 | 19 | 21 | 22 | 23 | 23 | + 10·9 | + 23·7 | + 13·8 | + 3·3 | + 2·3 | + 2·2 |
| බුලත් හා පුවක් .. .. .. | 34 | 37 | 38 | 34 | 36 | 33 | 30 | + 7·3 | + 1·6 | — 8·3 | + 4·7 | — 7·2 | — 9·9 |
| දර .. .. .. | 14 | 14 | 15 | 15 | 15 | 16 | 15 | + 3·7 | + 3·5 | + 2·7 | + 2·7 | + 2·6 | — 7·6 |
| පශු සම්පත .. .. .. | 142 | 134 | 139 | 136 | 150 | 156 | 187 | — 5·6 | + 4·3 | — 2·7 | + 10·4 | + 3·9 | + 20·1 |
| මාළු .. .. .. | 60 | 69 | 86 | 101 | 125 | 137 | 153 | + 13·9 | + 25·3 | + 17·1 | + 24·4 | + 9·6 | + 11·1 |
| විවිධ කෘෂිකර්ම හා වන ද්‍රව්‍ය නිෂ්පාදන .. | 49 | 52 | 53 | 55 | 59 | 62 | 66 | + 5·1 | + 2·9 | + 2·6 | + 7·5 | + 5·8 | + 5·8 |
| පාවිච්චි කළ ආනයන භාණ්ඩ හැර (අ) .. | –25 | –25 | –25 | –33 | –40 | –44 | –47 | | | | | | |
| දේශීය නිෂ්පාදනය නිසා එකතු වූ වටිනාකම .. | 1,276 | 1,341 | 1,385 | 1,426 | 1,531 | 1,586 | 1,506 | + 5·1 | + 3·3 | + 2·9 | + 7·3 | + 3·6 | — 5·0 |
| **2. කර්මාන්ත (ප්‍රාග්ධන සම්පාදනය අත්හැර)** | | | | | | | | | | | | | |
| කම්හල් කර්මාන්තය .. .. | 314 | 379 | 416 | 454 | 595 | 647 | 719 | + 20·8 | + 9·8 | + 9·0 | + 31·1 | + 8·7 | + 11·2 |
| ගෘහ කර්මාන්ත .. .. .. | 110 | 113 | 116 | 119 | 127 | 131 | 135 | + 2·5 | + 2·9 | + 2·9 | + 6·6 | + 3·0 | + 3·1 |
| පාවිච්චි කළ ආනයන භාණ්ඩ හැර .. | –168 | –187 | –191 | –167 | –238 | –245 | –264 | | | | | | |
| දේශීය නිෂ්පාදන නිසා එකතු වූ වටිනාකම .. | 255 | 305 | 342 | 406 | 484 | 533 | 590 | + 19·3 | + 12·1 | + 19·0 | + 19·1 | + 10·0 | + 10·8 |

(අ) වෙළඳ වටිනාකම අනුව

* තේ හා පොල් සඳහා ඇස්තමේන්තු සකස් කර ඇත්තේ ඒක ජන පාරිභෝජනය පිළිබඳ සංඛ්‍යා තොරතුරු පදනම් කරගෙනය. 1959 සිට 1964 දක්වා වූ වර්ෂය සඳහා ඇස්තමේන්තු සකස් කිරීම සඳහා 1953 පාරිභෝගික අය වැය සමීක්ෂණයෙන් සංඛ්‍යා තොරතුරු ලබාගන්නා ලද අතර 1963 සහ 1964 සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේදී 1963 පාරිභෝගික අයවැය සමීක්ෂණයෙන් සංඛ්‍යා තොරතුරු ලබාගන්නා ලදී. මේ අනුව 1963 සහ 1964 සඳහාවූ ඇස්තමේන්තු ඊට පෙර වර්ෂවල ඇස්තමේන්තු සමග කොහෙත්ම සැසඳෙන්නේ නොවේ.

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුව
සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව
කර්මාන්ත දෙපාර්තමේන්තුව
ධීවර දෙපාර්තමේන්තුව

පොල් නිෂ්පාදනය හීනවූ බැවින්, එහි අපනයන පරිමාව (ගෙඩි ගණනින්) සියයට 21.6 කින් පහළ වැටිණි. 1964 එය සියයට 33.7 කින් ඉහළ ගොස් තිබුනේය. කොප්පරා සහ පොල් තෙල් මිල පිළිවෙලින් සියයට 24.9 ක හා සියයට 27.0 ක වැඩිවීමක් පිළිබිඹු කරමින් පොල් නිෂ්පාදිතවල අපනයන මිල තියුණු ලෙස වැඩිවූ බැවින් පොල්වල අපනයන වටිනාකම පහළ වැටුනේ සියයට 1.8 කින් පමණි. 1965 දී පොල් නිමැවුම පහළ වැටුනේ අයහපත් කාලගුණය හේතු කොට ගෙනය.

මේ අනුව, ඉකුත් වර්ෂයේදී සියයට 8.1 කින් වැඩිවූ මුළු අපනයන වටිනාකම මෙම වර්ෂයේදී සියයට 4.0 කින් වැඩි විය. එහෙත් අපනයන තොග ඇස්තමේන්තු රුපියල් කෝටි 7.5 ක පහළ වැටීමක් දක්වයි. එහෙයින්, තොගවල අගයෙහි වෙනස්වීම් ද ගැණෙන, අපනයන අංශයේ ශුද්ධ නිමැවුමේ වටිනාකම ඉහළ ගියේ සියයට 2.2 කින් පමණි. 1954 දී මීට හාත්පසින්ම වෙනස් පරිදි, අපනයන අංශයේ ශුද්ධ නිමැවුමේ වටිනාකම සියයට 5.4 කින් ඉහළ ගියේය.

දේශීය අංශයේ ශුද්ධ නිමැවුමෙහි වටිනාකමද 1965 දී සුළු අනුපාතිකයකින් වැඩි විය. අයහපත් කාලගුණ තත්වය හේතු කොට ගෙන වී නිෂ්පාදනය බුසල් කෝටි 5.05 සිට බුසල් කෝටි 3.56 දක්වා පහළ වැටුණි. මෙය වූ කලී සියයට 29.5 ක පහළ වැටීමෙකි. දේශීය අංශයේ ශුද්ධ නිමැවුමෙහි වටිනාකම වැඩිවීම කෙරෙහි ප්‍රධාන වශයෙන්ම හේතුවූයේ කර්මාන්ත, පශු, ධීවර, රජයේ හා අනෙකුත් සේවා-වන්හි නිමැවුම ප්‍රාසාරණය වීමය. කාර්මික නිෂ්පාදන වල ශුද්ධ නිමැවුමෙහි වටිනාකම සියයට 10.8 කින් වැඩිවී ඇතැයි තාවකාලික වශයෙන් ඇස්තමේන්තු කර ඇත. ප්ලාස්ටික් නිෂ්පාදනය, සිමෙන්ති හා සිමෙන්ති නිෂ්පාදිත සැලකිය යුතු අන්දමින් වැඩිවිය. මාළු නිෂ්පාදනයෙහි ශුද්ධ නිමැවුම සියයට 11.0 කින් වැඩිවී ඇතැයි ඇස්තමේන්තු කර ඇත. රජයේ ශුද්ධ නිමැවුමෙහි වටිනාකම වැඩිවීම කෙරෙහි හේතු වූයේ ප්‍රධාන වශයෙන්ම කෘෂිකර්මාන්තයෙහි ප්‍රාග්ධන සම්පාදනය සඳහා වියදම වැඩිවීම සහ සෞඛ්‍යය හා අධ්‍යාපනය සඳහා වර්තන වියදම් වැඩිවීමය.

දළ දේශීය නිෂ්පාදිතය, එනම් අපනයන අංශයේ හා දේශීය අංශයේ ශුද්ධ නිමැවුමේ මුළු එකතුව, 1964 සංශෝධිත සංඛ්‍යාව වූ රුපියල් කෝටි 714.0 සිට 1965 දී රුපියල් කෝටි 740.4 දක්වා සියයට 3.7 කින් වැඩිවිය. 1964/1965 අයවැය ලේඛනයෙන් පැනවුන ලාභාංශ හා ලාභ පැවරීම කල්තැබීමේ නීත්‍යානුකූල බලය තව දුරටත් පැවැත්මේ ප්‍රතිඵලයක් වශයෙන් ආයෝජන ආදායම් ඇදීයාම 1964 සංඛ්‍යාව වූ රුපියල් කෝටි3.6 සිට 1965 දී රුපියල් කෝටි 1·5 දක්වා පහළ වැටු-නේය. මේ අනුව, සියයට 4.0 ක් වූ දළ ජාතික නිෂ්පාදිතයේ වැඩිවීම දළ දේශීය නිෂ්පාදිතයේ වැඩිවීමට වඩා අධික විය.

දේශීය පරිභෝජනය සඳහා මෙරට නිෂ්පාදිත භාණ්ඩ පිළිබඳ තොරතුරු නිෂ්පාදක මිල අනුව II (අ) 3 සංඛ්‍යා සටහනෙහි දැක්වෙයි. මෙම භාණ්ඩවල නිෂ්පාදක වටිනාකමෙහි ප්‍රධාන වෙනස්වීම් දක්නට ලැබුනේ වී, පශු, හා කාර්මික නිෂ්පාදන සම්බන්ධයෙනි. 1964/65 මහ කන්නයේ හා 1965 යල කන්නයේ අස්වැන්න පාළුවීම හේතු කොට ගෙන වී නිෂ්පාදක මිල සියයට 29.8 කින් පහළ වැටිණි. මස් හා කිරි නිෂ්පාදනය වැඩිවීම හේතු කොට ගෙන පශු නිෂ්පාදන සියයට 20.1 කින් ඉහළ ගිය බැව් තාවකාලික සංඛ්‍යා තොරතුරු වලින් පෙනී යයි. කාර්මික නිෂ්පාදනවල නිෂ්පාදක වටිනාකම සියයට 9.9 කින් ඉහළ ගියේ කර්මාන්තශාලාවේදී මිල මෙන්ම නිමැවුමද වැඩිවීම හේතු කොට ගෙනය.

පාරිභෝජනයෙහි හා ප්‍රාග්ධන සම්පාදනයෙහි එකතුව ඇස්තමේන්තු කිරී-මෙන් සකසාගත් දළ ජාතික වියදම පිළිබඳ සංඛ්‍යා, පවත්නා වෙළඳ මිල අනුව II (අ) 4 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. දළ ජාතික නිෂ්පාදිතය සහ චක්‍ර බදු (ශුද්ධ

# සංඛ්‍යා සටහන II (අ) 4
## දළ-ජාතික වියදම්-පවත්නා වෙළඳ මිළ අනුව

| | රුපියල් දශ ලක්ෂ | | | | | | | වෙනසේ සියයට ගණන | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1965 | 1962න් 1961 ට | 1963න් 1962 ට | 1964න් 1963 ට | 1965න් 1964 ට |
| **1. පෞද්ගලික පාරිභෝජනය** | | | | | | | | | | | |
| (අ) භාණ්ඩ හා සාධක නොවන සේවා ආනයන | | | | | | | | | | | |
| (i) ආහාර සහ අනෙකුත් පෞද්ගලික පාරිභෝජන භාණ්ඩ ආනයන (අ) .. | 1,812 | 1,907 | 1,709 | 1,740 | 1,547 | 1,753 | 1,609 | + 1.8 | —11.1 | +13.3 | — 8.2 |
| (ii) සාධක නොවන සේවා ආනයන .. | 178 | 152 | 137 | 128 | 129 | 109 | 111 | — 6.4 | + 0.9 | —15.7 | — 1.6 |
| **එකතුව** .. | 1,990 | 2,059 | 1,845 | 1,868 | 1,676 | 1,861 | 1,720 | + 1.2 | —10.3 | +11.1 | — 7.6 |
| (ආ) මෙරට නිපදවන භාණ්ඩ (අ) හා සේවා | | | | | | | | | | | |
| (i) මෙරට නිපදවන භාණ්ඩ ✱ . | 2,093 | 2,208 | 2,282 | 2,416 | 2,650 | 2,806 | 2,952 | + 5.9 | + 9.7 | + 5.9 | + 5.2 |
| (ii) ගෙවල් කුලී .. | 186 | 197 | 216 | 226 | 247 | 264 | 283 | + 4.3 | + 9.6 | + 6.9 | + 6.9 |
| (iii) ප්‍රවාහණය හා පණිවුඩ හුවමාරුව .. | 241 | 256 | 272 | 286 | 294 | 334 | 361 | + 4.9 | + 2.8 | +13.8 | + 8.0 |
| (iv) සේවා අන්තැනක නොසඳහන් .. | 467 | 475 | 488 | 506 | 524 | 544 | 564 | + 3.6 | + 3.7 | + 3.7 | + 3.7 |
| රජයේ මිලට ගැනුම් හැර .. | —110 | — 41 | —102 | —133 | — 50 | — 50 | — 55 | | | | |
| **එකතුව** .. | 2,878 | 3,095 | 3,157 | 3,301 | 3,665 | 3,898 | 4,104 | + 4.6 | +11.0 | + 6.4 | + 5.3 |
| (ඇ) අනේවාසිකයන් විසින් මිලයට ගත් භාණ්ඩ හා සේවා හැර .. | —195 | —169 | —162 | —170 | —171 | —130 | —132 | | | | |
| මුළු පෞද්ගලික පාරිභෝජනය .. | **4,673** | **4,985** | **4,840** | **4,999** | **5,170** | **5,629** | **5,692** | **+ 3.3** | **+ 3.4** | **+ 8.9** | **+ 1.1** |
| **2. රජයේ පාරිභෝජනය** | | | | | | | | | | | |
| (i) භාණ්ඩ හා සේවා සඳහා වර්තන වියදම් මහ ආණ්ඩුව .. | 771 | 803 | 831 | 880 | 906 | 980 | 1,006 | + 5.8 | + 3.0 | + 8.2 | + 2.7 |
| (ii) භාණ්ඩ හා සේවා සඳහා වර්තන වියදම් පලාත් ආණ්ඩු සභා .. | 90 | 87 | 74 | 78 | 83 | 88 | 87 | + 5.8 | + 5.9 | + 5.8 | — 0.7 |
| (iii) රජයේ ගොඩනැගිලි සඳහා ආරෝපිත කුලී .. | 20 | 21 | 21 | 22 | 22 | 23 | 23 | + 2.4 | + 2.3 | + 2.3 | + 2.2 |
| **එකතුව** .. | **881** | **911** | **926** | **979** | **1,011** | **1,090** | **1,116** | **+ 5.7** | **+ 3.2** | **+ 7.9** | **+ 2.4** |
| **3. දළ-දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය** | | | | | | | | | | | |
| (i) රජයේ .. | 256 | 238 | 249 | 260 | 257 | 239 | 262 | + 4.2 | — 1.2 | — 7.0 | + 9.7 |
| (ii) රජයේ ව්‍යාපාර .. | 80 | 79 | 92 | 104 | 127 | 102 | 125 | +13.1 | +22.8 | —20.0 | +22.7 |
| (iii) පෞද්ගලික අංශය හා රජයේ සමායතන . | 733 | 649 | 637 | 668 | 607 | 682 | 582 | + 4.9 | — 9.2 | +12.4 | —14.6 |
| **එකතුව** .. | **1,069** | **966** | **978** | **1,031** | **991** | **1,023** | **969** | **+ 5.5** | **— 4.0** | **+ 3.2** | **— 5.3** |
| **4. තොග වෙනස්වීම්** | | | | | | | | | | | |
| (i) රජයේ (ii) රජයේ ව්‍යාපාර } ආ | — 22 | — 14 | + 54 | + 40 | + 5 | — 5 | + 22 | | | | |
| (iii) පෞද්ගලික අංශය හා රජයේ සමායතන (ඇ) .. | + 12 | — 31 | + 16 | — 41 | + 3 | — 36 | — 67 | | | | |
| **එකතුව** .. | **— 10** | **— 45** | **+ 69** | **— 1** | **+ 8** | **— 40** | **— 45** | | | | |
| **5. දළ-දේශීය වියදම් (ඈ)** .. | **6,613** | **6,817** | **6,813** | **7,009** | **7,179** | **7,702** | **7,732** | **+ 2.9** | **+ 2.4** | **+ 7.3** | **+ 0.4** |
| **6. පිටරට ශුද්ධ ආයෝජන (ඉ)** | **—208** | **—221** | **— 94** | **—140** | **—168** | **—160** | **+ 44** | | | | |
| **7. ජාත්‍යන්තර, ත්‍යාග හා ප්‍රේෂණවලින් ලැබීම් (ශුද්ධ) හැර** .. | **+ 12** | **— 22** | **— 11** | **— 7** | **— 13** | **— 40** | **— 36** | | | | |
| **8. දළ-ජාතික වියදම** .. | **6,416** | **6,575** | **6,708** | **6,862** | **6,999** | **7,501** | **7,740** | **+ 2.3** | **+ 2.0** | **+ 7.2** | **+ 3.2** |

(අ) සිල්ලර වටිනාකම අනුව

සංඛ්‍යා: II අ–2 සංඛ්‍යා සටහනේ සංලක්ෂයන් බලන්න

(ආ) ආනයන කළ හාල්, තිරිඟු පිටි හා සීනි, සහතික මිලට ගත් වී, හා අරක්කුවල තොග වෙනස්වීම පමණකි.

(ඇ) තේ, රබර් සහ පශු යම්පත් තොග වෙනස්වීම් පමණයි.

(ඈ) පාරිභෝජන වියදම්, දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය (–දළ–) සහ තොග වෙනස්වීම් පමණයි.

(ඉ) පිටරට ශුද්ධ ආයෝජන=මෙරට වර්තන ගිණුම් අතිරික්තය.

✱ තේ හා පොල් ඇස්තමේන්තු සකස් කර ඇත්තේ ඒක ජන පරිභෝජනය පිළිබඳ සංඛ්‍යා තොරතුරු පදනම් කරගෙනය. 1959 සිට 1962 දක්වා වූ වර්ෂ සඳහා ඇස්තමේන්තු සකස් කිරීම සඳහා 1953 පාරිභෝගික අයවැය සමීක්ෂණයෙන් සංඛ්‍යා තොරතුරු ලබා ගන්නා ලද අතර, 1963 සහ 1964 සඳහා ඇස්තමේන්තු 1963 පාරිභෝගික අයවැය සමීක්ෂණයෙන් සංඛ්‍යා තොරතුරු ලබා ගන්නා ලදී. මේ අනුව 1963 සහ 1964 සඳහා වූ ඇස්තමේන්තු ඊට පෙර වර්ෂවල ඇස්තමේන්තු සමග කොහෙත්ම සැසඳෙන්නේ නොවේ.

## සංඛ්‍යා සටහන II (අ) 5
## දළ-ජාතික නිෂ්පාදිත වියදම් පවත්නා මිල අනුව

රුපියල් දශ ලක්ෂ

| | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1965 |
|---|---|---|---|---|---|---|---|
| 1. දළ-ජාතික නිෂ්පාදිතය-සාධක මිල අනුව .. | 5,854 | 6,080 | 6,142 | 6,418 | 6,716 | 7,104 | 7,388 |
| 2. අනියම් බදු (අ) ආධාර අඩු කොට .. | 389 | 413 | 390 | 472 | 458 | 420 | 493 |
| 3. දළ-ජාතික නිෂ්පාදිතය වෙළෙඳ මිල අනුව .. | 6,243 | 6,493 | 6,532 | 6,890 | 7,175 | 7,524 | 7,882 |

| | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1965 |
|---|---|---|---|---|---|---|---|
| 4. පාරිභෝජන වියදම පෞද්ගලික .. | 4,673 | 4,985 | 4,840 | 4,999 | 5,170 | 5,629 | 5,692 |
| 5. පාරිභෝජන වියදම රජයේ .. .. | 881 | 911 | 926 | 979 | 1,011 | 1,090 | 1,116 |
| 6. දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය පෞද්ගලික අංශය සහ රජයේ සමායතන .. .. .. | 745 | 618 | 652 | 627 | 610 | 646 | 515 |
| 7. දළ-දේශීය ප්‍රාග්ධන සම්පාදනය රජයේ හා රජයේ ව්‍යාපාර .. .. | 314 | 303 | 395 | 403 | 389 | 336 | 409 |
| 8. දළ දේශීය වියදම (ආ) .. .. | 6,613 | 6 817 | 6,813 | 7,009 | 7,179 | 7,702 | 7,732 |
| 9. භාණ්ඩ හා සාධක නොවන සේවා අපනයන .. .. .. | 2,016 | 2,011 | 1,907 | 1,971 | 1,903 | 1,937 | 2,081 |
| 10. භාණ්ඩ හා සාධක නොවන සේවා ආනයන හැර .. .. .. | -2,176 | -2,209 | -1,972 | -2,070 | -2,031 | -2,102 | -2,058 |
| 11. දළ-දේශීය නිශ්පාදිත වියදම-වෙළෙඳ මිල අනුව .. .. .. | 6,453 | 6,619 | 6,748 | 6,910 | 7,051 | 7,537 | 7,755 |
| 12. පිටරටින් ලැබුන සාධක ආදායම-ශුද්ධ .. | – 37 | – 44 | – 40 | – 47 | – 53 | – 36 | – 15 |
| 13. ඉතිරි: තොගවල නොදත් වෙනස්කම් හා සංඛ්‍යා විෂමතා .. .. .. | -173 | – 82 | -176 | + 27 | +177 | +23 | + 141 |
| **14. දළ-ජාතික නිෂ්පාදිත වියදම වෙළෙඳ මිල අනුව (ඇ)** .. | 6,243 | 6,493 | 6,532 | 6,890 | 7,175 | 7,524 | 7,882 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

(අ) පලාත් ආණ්ඩු සභා බදු අයත් වෙයි.
(ආ) පාරිභෝගික වියදම හා දළ ජාතික ප්‍රාග්ධන සම්පාදන වියදම් සමාන වෙයි.
(ඇ) මේ සංඛ්‍යා සටහනෙහි-ශීර්ෂ 11 සහ 12 විජත ඓක්‍යය දළ ජාතික වියදමට සමානය. මෙය මේ සංඛ්‍යා සටහනේ 14 වැනි ශීර්ෂයට වඩා වෙනස් වන්නේ (දළ ජාතික නිෂ්පාදිත වියදම (II (අ) 3 සංඛ්‍යා සටහනේ 8 ශීර්ෂය) වෙළෙඳ මිල අනුව 13 වැනි ශීර්ෂයේ දක්වා ඇති ප්‍රමාණයෙන් පමණකි. (තොගවල නොදත් වෙනස්කම් හා සංඛ්‍යා විෂමතා).

එකට එකතු කිරීමෙන් සකසා ගත් දළ ජාතික වියදම් ඇස්තමේන්තු II (අ) 5 සංඛ්‍යා සටහනෙහි දක්වෙයි. 1964 දී සියයට 7.2 කින් ඉහළ ගිය දළ ජාතික වියදම 1965 දී ඉහළ ගියේ සියයට 3.2 කින් පමණි. 1965 දී ඇති වූ දළ ජාතික වියදමෙහි සුළු සාපේක්ෂ වැඩිවීම පිළිබිඹු කරනුයේ පෞද්ගලික පාරිභෝජන භාණ්ඩ මෙන්ම ප්‍රාග්ධන භාණ්ඩ වලද ආනයන අඩුවීමය.

1965 දී පෞද්ගලික පරිභෝජන වියදම වැඩිවූයේ සියයට 11 කින් පමණි. මෙරට නිපදවුන භාණ්ඩ සහ සේවා සඳහා වූ පෞද්ගලික පරිභෝජන වියදමේ වැඩිවීම ආනයන සඳහා වූ වියදම අඩුවීමෙන් බොහෝ දුරට මැකී ගියේය. පාරි භෝගික වියදම සියයට 2.4 කින් ප්‍රාසාරණය වුවද එය ඉකුත් වර්ෂයේ දක්නට ලැබුන සියයට 7·9 ක් වූ වැඩිවීමේ අනුපාතිකයට වඩා අඩුවිය. ප්‍රාග්ධන භාණ්ඩ ආනයන අඩුවීමක් පිළිබිඹු කරමින් පෞද්ගලික අංශයේ හා රජයේ සමායතනවල ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය සියයට 14.6 කින් පහත වැටුන නමුදු, රාජ්‍ය අංශයේ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදිතය සියයට 13 6 කින් ඉහළ ගියේය.

මේ අනුව, පෞද්ගලික අංශය හා රාජ්‍ය අංශය යන දෙකෙහිම මුළු ස්ථාවර ප්‍රාග්ධන සම්පාදිතය සියයට 5.3 කින් පහළ වැටිණි. 1964 දී එය සියයට 3.2 කින් ඉහළ ගොස් තිබුනේය.

පෞද්ගලික පරිභෝජන වියදම් පිළිබඳ විස්තර පවත්නා වෙළෙඳ මිල අනුව II (අ) 6 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. ආනයන සඳහා වූ පාරිභෝගික වියදමේ පහළ වැටීම සහල්, පිටි හා සීනි හැර අනෙකුත් ශීර්ෂයන්ට සම්බන්ධ බැව් මෙම සංඛ්‍යා සටහනින් පෙනී යනවා ඇත. 1965 දී සහල්, පිටි හා සීනි ආනයනය සඳහා ගිය වියදම සියයට 15.7 කින් වැඩි වී ඇති බැව් වියදම් පිළිබඳ සංඛ්‍යා තොරතුරු වලින් *පෙනී යයි. එහෙත්, අනෙකුත් ආනයන සඳහා වූ පාරිභෝගික වියදම සියයට 18.2 කින් තියුණු ලෙස අඩු වූයේය. ඉකුත් වර්ෂයේදී ඒ සඳහා ගිය වියදම මීට ප්‍රතිවිරුද්ධ ලෙස සියයට 20.0 කින් වැඩිවී තිබිණි.

මෙරට නිපදවන භාණ්ඩ සඳහා වූ පාරිභෝගික පැහැදම 1965 දී තවදුරටත් ප්‍රාසාරණය විය. 1965 දී පොල්වල සිල්ලර මිල ඉහළයාම හේතුකොටගෙන පොල් නිෂ්පාදිත සඳහා වූ වියදමෙහි සියයට 18.4 ක වැඩිවීමෙක් දක්නට ලැබුණි. තාවකාලික සංඛ්‍යා තොරතුරු අනුව, මස් හා කිරි පරිභෝජනය වැඩිවීම් ප්‍රතිඵල-යක් වශයෙන්, පශු නිෂ්පාදිත සඳහා වූ වියදම සියයට 18.6 කින් වැඩිවිය. එසේ වුවද, මෙරට සහල් සඳහා වූ වියදමෙහි සියයට 25.8 ක පහළ වැටීමෙක් සටහන් විය. මෙයට හේතු වූයේ මුලින් සඳහන්කරන්නට යෙදුන අස්වැන්න පාළුවීමෙන් වී නිෂ්පාදනය අඩුවීමය.

ප්‍රාග්ධන සම්පාදනය පිළිබඳ විස්තර II (අ) 7 සංඛ්‍යා සටහනෙහි දක්වේ. පෞද් ගලික අංශයේ හා රාජ්‍ය සමායතනවල ප්‍රාග්ධන සම්පාදනය පිළිබඳ සංඛ්‍යා ඇස්තමේ න්තුකර ඇත්තේ ප්‍රධාන වශයෙන්ම ප්‍රාග්ධන භාණ්ඩ ආනයනය පදනම්කර ගෙනය. 1965 දී ප්‍රාග්ධන භාණ්ඩ ආනයනය අඩුවීම පිළිබිඹු කරමින් මෙම අංශයෙහි ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය සියයට 14.6 කින් පහළ වැටුනේය. මේ අනුව, පෞද්ගලික අංශයේ මුළු ප්‍රාග්ධන සම්පාදනයෙන් අඩකටත් වැඩිවන ගොඩනැගිලි හා අනෙකුත් ඉදිකිරීම් සමහරක් සියයට 7.3 කින් පහළ වැටිණි. යන්ත්‍රාගාර හා යන්ත්‍රෝපකරණ සහ "අනෙකුත්" ප්‍රාග්ධන භාණ්ඩ සඳහා කැරුන ආයෝජනයද සියයට 25·1 කින් ඉහළ ගියේය.

* මෙම සංඛ්‍යා, ආහාර දෙපාර්තමේන්තුව විසින් සමූපකාර වෙළෙඳ සැල් හා ලියාපදිංචි වෙළඳුන් මාර්ගයෙන් පරිභෝජනය සඳහා නියම වශයෙන් නිකුත් කරන ලද සහල්, පිටි හා සීනි ප්‍රමාණයන් පිළිබඳවය. සීනි හා පිටි සම්බන්ධයෙන් වූ ඉහත කී සංඛ්‍යා 1965 දී තියුණු ලෙස ඉහළ යාමට හේතු වූයේ සමූපකාර හා වෙළෙඳුන් වෙතැති මෙම භාණ්ඩ වර්ග තුනෙහි තොග වැඩිවීම විය හැකිය. එබැවින් සහල්, පිටි හා සීනි වල මුළු පරිභෝජනයේ නියම වැඩිවීම අඩු වූවා සේ පෙනී යයි.

සංඛ්‍යා II (අ) 6

## පෞද්ගලික පාරිභෝජන වියදම් සැකැසුම-පවත්නා වෙළෙඳ මිල අනුව

| | රුපියල් දශ ලක්ෂ | | | | | | | වෙනසෙහි සියයට ගණන | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1965 | 1962න් 1961 ට | 1963න් 1962 ට | 1964න් 1963 ට | 1965න් 1964 ට |
| **අ. භාණ්ඩ හා සාධක නොවන ආනයන** | | | | | | | | | | | |
| (i) සහල්, තිරිඟු පිටි සහ සීනි .. | 485 | 482 | 513 | 534 | 517 | 517 | 598 | + 4·1 | — 3·2 | — 0·1 | +15·7 |
| (ii) අනෙක් පෞද්ගලික පාරිභෝජන භාණ්ඩ .. | 1,328 | 1,425 | 1,196 | 1,206 | 1,030 | 1,236 | 1,011 | + 0·9 | —14·6 | +20·0 | —18·2 |
| (iii) සාධක නොවන සේවා .. | 178 | 152 | 137 | 128 | 129 | 109 | 111 | — 6·4 | + 0·9 | —15·7 | + 1·6 |
| **එකතුව** .. | **1,990** | **2,059** | **1,845** | **1,868** | **1,676** | **1,861** | **1,720** | **+ 1·2** | **—10·3** | **+11·1** | **— 7·6** |
| **ආ. මෙරට නිපදවුනු භාණ්ඩ හා සේවා** | | | | | | | | | | | |
| (i) මෙරට නිපදවුනු භාණ්ඩ | | | | | | | | | | | |
| හාල් .. .. | 312 | 308 | 275 | 306 | 319 | 312 | 232 | +11·2 | + 4·4 | — 2·1 | —25·8 |
| පොල් නිෂ්පාදිත ✱ .. | 232 | 187 | 162 | 154 | 210 | 232 | 274 | — 4·8 | +35·8 | +10·5 | +18·4 |
| තේ ✱ .. .. | 63 | 67 | 69 | 70 | 78 | 79 | 78 | + 1·7 | +11·6 | + 0·5 | — 1·4 |
| අනෙකුත් ආහාර භෝග .. | 398 | 433 | 473 | 473 | 483 | 509 | 523 | ... | + 2·1 | + 5·3 | + 2·9 |
| දුම්කොළ .. .. | 20 | 22 | 27 | 31 | 32 | 32 | 33 | +13·8 | + 2·9 | + 2·5 | + 2·2 |
| බුලත්, පුවක් .. .. | 46 | 50 | 50 | 46 | 48 | 45 | 40 | — 8·3 | + 4·5 | — 7·3 | — 9·8 |
| දර .. .. | 15 | 16 | 17 | 17 | 17 | 18 | 17 | + 3·0 | — 1·2 | + 6·0 | — 7·3 |
| පශු සම්පත .. .. | 174 | 168 | 184 | 181 | 190 | 196 | 232 | — 1·8 | + 5·0 | + 3·1 | +18·6 |
| මාළු .. .. | 80 | 92 | 115 | 134 | 167 | 179 | 205 | +17·0 | +24·5 | + 7·2 | +14·2 |
| විවිධ කෘෂිකාර්මික දූව ඈ වන ද්‍රව්‍ය .. .. | 57 | 59 | 61 | 61 | 67 | 81 | 75 | —0·7 | + 9·9 | +20·8 | — 6·5 |
| කාර්මික නිෂ්පාදිත .. | 696 | 808 | 849 | 942 | 1,040 | 1,125 | 1,243 | +10·9 | +10·4 | + 8·1 | +10·5 |
| එකතුව .. .. | 2,093 | 2,208 | 2,282 | 2,416 | 2,650 | 2,806 | 2,952 | + 5·9 | + 9·7 | + 5·9 | + 5·2 |
| (ii) ගෙවල් කුලී .. .. | 186 | 197 | 216 | 226 | 247 | 264 | 283 | + 4·3 | + 9·6 | + 6·9 | + 6·9 |
| (iii) ප්‍රවාහණය හා පණිවිඩ හුවමාරුව .. | 241 | 256 | 272 | 286 | 294 | 334 | 361 | + 4·9 | + 2·8 | +13·8 | + 8·0 |
| (iv) සේවා (අන් තැනක නොසඳහන්) | | | | | | | | | | | |
| පුද්ගලයන්ට කරන ලද මූල්‍ය සේවා (අ) .. | 13 | 14 | 15 | 16 | 18 | 19 | 21 | + 8·0 | +10·5 | + 7·8 | + 6·2 |
| ක්‍රීඩා සහ විනෝද .. | 24 | 25 | 26 | 27 | 28 | 29 | 30 | + 2·7 | + 3·7 | + 4·0 | + 3·8 |
| ගෘහ සේවා .. .. | 200 | 203 | 209 | 218 | 227 | 236 | 245 | + 4·0 | + 4·0 | + 4·1 | + 3·9 |
| හෝටල් සහ ආපන ශාලා .. | 119 | 121 | 125 | 130 | 135 | 140 | 147 | + 4·0 | + 3·7 | + 4·3 | + 4·4 |
| වෘත්තීය සහ ආයතන සේවා අන් තැනක නොසඳහන් (ආ) . | 61 | 61 | 61 | 61 | 61 | 61 | 61 | ... | ... | ... | ... |
| පෞද්ගලික සේවා අන් තැනක නොසඳහන්(ඇ) .. | 50 | 51 | 52 | 54 | 57 | 59 | 61 | + 4·0 | + 4·1 | + 4·1 | + 3·7 |
| එකතුව .. .. | 467 | 475 | 488 | 506 | 524 | 544 | 564 | + 3·6 | + 3·7 | + 3·7 | + 3·7 |
| රජයේ දේශීය මිලදී ගැනීම් හැර | — 110 | —41 | —102 | —133 | — 50 | — 50 | — 55 | | | | |
| **මුළු එකතුව** .. .. | **2,878** | **3,095** | **3,157** | **3,301** | **3,665** | **3,898** | **4,104** | **+ 4·6** | **+11·0** | **+ 6·4** | **+ 5·3** |
| **ඇ. අනේවාසිකයන් විසින් මිලදී ගත් භාණ්ඩ හා සේවා හැර** .. .. | **— 195** | **—169** | **—162** | **—170** | **—171** | **—130** | **—132** | | | | |
| **මුළු පෞද්ගලික පාරිභෝජනය** .. | **4,673** | **4,985** | **4,840** | **4,999** | **5,170** | **5,629** | **5,692** | **+ 3·3** | **+ 3·4** | **+ 8·9** | **+ 1·1** |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

(අ) ව්‍යාපාර වලින් බාහිරව, බැංකු, රක්ෂණ සමාගම් සහ අනෙකුත් මූල්‍ය ආයතන විසින් ගෙවැසියනට කරන ලද සේවාවන්ගේ වටිනාකම.

(ආ) පෞද්ගලික වෛද්‍ය, නීති හා අධ්‍යාපනික සේවා සහ ලාභ නොඋපයන පුද්ගල මණ්ඩල (ආගමික සහ සුභ සාධක සංවිධාන, සහ වාණිජ සමිති ආදිය) වලින් කරන ලද සේවා.

(ඇ) ඩෝබි, බාබර්, වෛද්‍ය සහ අවමඟුල් කටයුතු භාර ගන්නන් විසින් කරන ලද සේවා.

✱ තේ හා පොල් සඳහා ඇස්තමේන්තු සකස්කර ඇත්තේ ඒකජන පරිභෝජනය පිළිබඳ සංඛ්‍යා තොරතුරු පදනම් කරගෙනය. 1959 සිට 1962 දක්වා වූ වර්ෂ සඳහා ඇස්තමේන්තු සකස් කිරීම් සඳහා 1953 පාරිභෝගික අයවැය සමීක්ෂණයෙන් සංඛ්‍යා තොරතුරු ලබා ගන්නා ලද අතර, 1963 සහ 1964 සඳහා ඇස්තමේන්තු සකස් කිරීම සඳහා 1963 පාරිභෝගික අයවැය සමීක්ෂණයෙන් සංඛ්‍යා තොරතුරු ලබා ගන්නා ලදී. මේ අනුව 1963 සහ 1964 සඳහා වූ ඇස්තමේන්තු ඊට පෙර වර්ෂ වල ඇස්තමේන්තු සමග කොහෙත්ම සැසඳෙන්නේ නොවේ.

## සංඛ්‍යා සටහන II (අ) 7

## දළ-ජාතික ප්‍රාග්ධන සම්පාදනය-පවත්නා වෙළඳ මිළ අනුව

| | රුපියල් දශ ලක්ෂ 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1965 | වෙනසේ සියයට ගණන 1962න් 1961 ට | 1963න් 1962 ට | 1964න් 1963 ට | 1965න් 1964 ට |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **අ. පෞද්ගලික අංශය සහ රජයේ සමායතන** | | | | | | | | | | | |
| (i) දළ-දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | | | | | | | | | | | |
| වගාකිරීම හා නැවත වගාකිරීම .. | 62 | 63 | 63 | 64 | 70 | 70 | 65 | + 1·3 | + 8·6 | + 0·7 | — 7·9 |
| ගොඩනැගිලි සහ අනෙකුත් සමහර ඉදි කිරීම් .. | 336 | 341 | 320 | 342 | 262 | 331 | 306 | + 6·8 | —23·5 | +26·3 | — 7·3 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ .. | 119 | 77 | 113 | 113 | 154 | 177 | 119 | — 0·2 | +36·0 | +14·7 | —32·5 |
| ප්‍රවාහනය .. | 153 | 109 | 85 | 92 | 63 | 50 | 63 | + 8·4 | —31·7 | —20·2 | +25·1 |
| ආනයන කළ ප්‍රාග්ධන භාණ්ඩ (අන් තැනෙක නොසඳහන්) .. | 64 | 59 | 55 | 57 | 59 | 55 | 29 | + 3·1 | + 3·5 | —6 ·8 | —46·5 |
| එකතුව .. | 733 | 649 | 637 | 668 | 607 | 682 | 582 | + 4·9 | — 9·2 | +12·4 | —14·6 |
| (ii) තොග වෙනස්වීම් | | | | | | | | | | | |
| තේ .. | + 1 | — 13 | — 3 | — 37 | — 17 | — 24 | — 64 | | | | |
| රබර් .. | — 3 | — 27 | + 19 | + 3 | + 20 | — 12 | — 11 | | | | |
| පශු සම්පත් .. | + 13 | + 9 | ... | — 7 | ... | ... | + 8 | | | | |
| එකතුව .. | + 12 | — 31 | + 16 | — 41 | + 3 | — 36 | — 67 | | | | |
| ජාතික ප්‍රාග්ධන සම්පාදනය .. | 745 | 618 | 652 | 627 | 610 | 646 | 515 | — 3.9 | — 2·6 | + 5·9 | —20·3 |
| **ආ. රාජ්‍ය සහ පොදු ව්‍යාපාර** | | | | | | | | | | | |
| (i) දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය .. | 336 | 317 | 341 | 364 | 384 | 341 | 387 | + 6·6 | + 5·6 | —11·3 | +13·6 |
| (ii) තොග වෙනස්වීම් | | | | | | | | | | | |
| ආනයනය කළ හාල්-තිරිඟු පිටි හා සීනි .. | + 13 | — 26 | — 12 | — 2 | ... | } —5 | } +22 | | | | |
| සහතික මිලට ගත් වී .. | — 35 | + 10 | + 65 | + 45 | + 10 | | | | | | |
| අරක්කු .. | ... | + 2 | ... | — 3 | — 5 | ... | ... | | | | |
| එකතුව .. | — 22 | — 14 | + 54 | + 40 | + 5 | — 5 | + 22 | | | | |
| දළ ජාතික ප්‍රාග්ධන සම්පාදනය .. | 314 | 303 | 395 | 403 | 389 | 336 | 409 | + 2·2 | — 3·6 | —13·6 | +21·6 |
| **ඇ. සියලුම අංශ** | | | | | | | | | | | |
| (i) දළ-දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය .. | 1,069 | 966 | 978 | 1,031 | 991 | 1,023 | 969 | + 5·5 | — 4·0 | + 3·2 | — 5·3 |
| (ii) තොග වෙනස්වීම් .. | — 10 | — 45 | + 69 | — 1 | + 8 | — 40 | — 45 | | | | |
| ජාතික ප්‍රාග්ධන සම්පාදනය .. | 1,059 | 921 | 1,047 | 1,030 | 999 | 982 | 924 | — 1·6 | — 3·0 | — 1·7 | — 5·9 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

රාජ්‍ය අංශයේ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය වැඩිවීමෙන් පෞද්ගලික අංශයේ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනයෙහි ඇති වූ පහළ වැටීම තරමක් දුරට මැකී ගියේය ප්‍රධාන වශයෙන්ම දුම්රිය දෙපාර්තමේන්තුව හා විදුලිය දෙපාර්තමේන්තුව වැනි ව්‍යවසායක දෙපාර්තමේන්තු විසින් කරන ලද ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය සියයට 22.7 කින් ඉහළ ගිය අතර විශේෂයෙන්ම කෘෂිකර්මාන්ත හා වාරිමාර්ග දෙපාර්තමේන්තු වැනි රජයේ අනෙකුත් දෙපාර්තමේන්තු විසින් කැරුන ආයෝජන සියයට 9.7 කින් ඉහළ ගියේය. මේ අනුව දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනයෙහි එකතුව පහළ වැටුනේ සියයට 5.3 කින් පමණි.

සංඛ්‍යා සටහන II (අ) 8

**සම්පත් මාර්ග සහ ඒ උපයෝගී කර ගැනීම-පවත්නා වෙළෙඳ මිල අනුව**

| | රුපියල් දශ ලක්ෂ | | | | | | | වෙනසේ සියයට ගණන | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1965 | 1960න් 1959 ට | 1961න් 1960 ට | 1962න් 1961 ට | 1963න් 1962 ට | 1964න් 1963 ට | 65න් 64 ට |
| අ. සම්පත් මාර්ග | | | | | | | | | | | | | |
| දළ ජාතික නිෂ්පාදිතය (අ) .. | 6,453 | 6,619 | 6,748 | 6,909 | 7,050 | 7,537 | 7,756 | + 2·6 | + 1·9 | 2·4 | + 2·0 | + 6·9 | +2·9 |
| භාණ්ඩ සහ සාධක නොවන සේවා ආනයනය .. | 2,176 | 2,209 | 1,972 | 2,070 | 2,031 | 2,102 | 2,058 | + 1·5 | −10·7 | + 5·0 | −1·9 | + 3·5 | −2·1 |
| එකතුව .. | **8,629** | **8,828** | **8,720** | **8,979** | **9,081** | **9,639** | **9,814** | **+ 2.3** | **− 1·2** | **+ 3·0** | **+ 1·1** | **+ 6·1** | **+1·8** |
| ආ. උපයෝගී කරගැනීම | | | | | | | | | | | | | |
| පාරිභෝජනය .. | 5,554 | 5,896 | 5,766 | 5,978 | 6,181 | 6,719 | 6,808 | + 6·2 | − 2·2 | + 3·7 | + 3·4 | + 8·7 | +1·3 |
| දළ-ජාතික ප්‍රාග්ධන සම්පාදනය .. | 1,059 | 921 | 1,047 | 1,030 | 999 | 982 | 924 | −13.0 | +13·7 | − 1·6 | −3·0 | −1·7 | −5·9 |
| භාණ්ඩ සහ සාධක නොවන සේවා ආනයනය .. | 2,016 | 2,011 | 1,907 | 1,971 | 1,903 | 1,937 | 2,081 | −0·3 | − 5·2 | + 3·4 | −3·5 | + 1·8 | +7·4 |
| එකතුව .. | **8,629** | **8,828** | **8,720** | **8,979** | **9,081** | **9,638** | **9,814** | **+ 2.3** | **− 1·2** | **+ 3·0** | **+ 1·1** | **+ 6·1** | **+1·8** |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

(අ) II (අ) 2 සංඛ්‍යා සටහනේ 3 වැනි ශීර්ෂය වන මෙය, වියදම් අංශයේ පාරිභෝජන හා ප්‍රාග්ධන සම්පාදන ඇස්තමේන්තු වලට සරිලන සේ, ආධාර හැර අනියම් බදු සඳහා ද (I (අ) 5 සංඛ්‍යා සටහනේ 2 වැනි ශීර්ෂය) තොගවල නොදත් වෙනස්කම් හා සංඛ්‍යා විෂමතා (II (අ) 5 සංඛ්‍යා සටහනේ 13 වැනි ශීර්ෂය) සමග ගලපා ඇත.

**ලබාගත හැකි සම්පත් මාර්ග හා ඒවා උපයෝගී කර ගැනීම**

එක් අතෙකින් නිෂ්පාදනය හා ආනයනය මගින් රටට ලබාදුන් සම්පත් මාර්ග ද, අනෙක් අතින් පවත්නා සම්පත් මාර්ග පරිභෝජනය, දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය සහ අපනයන අතර බෙදී ගිය ආකාරයද II (අ) 8 සංඛ්‍යා සටහනින් දක්වා ඇත.

1965 දී ලබාගත හැකි මුළු සම්පත් මාර්ග වැඩිවූයේ සියයට 1.8 කින් පමණි. 1964 දී එය සියයට 6.1 කින් වැඩි වී ඇත. මෙම වැඩිවීම කෙරෙහි හේතුවූයේ ආනයන සියයට 2.1 කින් පහළ වැටී තිබියදී දේශීය නිෂ්පාදනය වැඩිවීමය. සම්පත් මාර්ග උපයෝගී කර ගැනීම පිළිබඳ සලකා බලන කල, පරිභෝජනය සඳහා උපයෝගී කරගන්නා ලද සම්පත් මාර්ග සියයට 1 3 කින් ඉහළ ගිය අතර ප්‍රාග්ධන සම්පාදනය සඳහා උපයෝගී කර ගන්නා ලද සම්පත් මාර්ග සියයට 5.9 කින් පහළ වැටුනේය. අපනයන සඳහා යොදන ලද සම්පත් මාර්ග සියයට 7.4 කින් වැඩිවිය.

## සංඛ්‍යා සටහන II (අ) 9

## දළ - ජාතික වියදම සහ තිබෙන සම්පත් මාර්ග පවත්නා වෙළඳ මිල අනුව

| | 1959 | | 1960 | | 1961 | | 1962 | | 1963 | | 1964 | | 1965 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රුපියල් දශ ලක්ෂ | 7 වැනි පෙළේ සියයට ගණන | රුපියල් දශ ලක්ෂ | 7 වැනි පෙළේ සියයට ගණන | රුපියල් දශ ලක්ෂ | 7 වැනි පෙළේ සියයට ගණන | රුපියල් දශ ලක්ෂ | 7 වැනි පෙළේ සියයට ගණන | රුපියල් දශ ලක්ෂ | 7 වැනි පෙළේ සියයට ගණන | රුපියල් ශ ලක්ෂ | 7 වැනි පෙළේ සියය ටගණන | රුපියල් දශ ලක්ෂ | 7 වැනි පෙළේ සියයට ගණන |
| 1. පාරිභෝජන වියදම: පෞද්ගලික .. .. | 4,673 | 72·8 | 4,985 | 75·8 | 4,840 | 72·2 | 4,999 | 72·8 | 5,170 | 73·9 | 5,629 | 75·0 | 5,692 | 73·5 |
| 2. පාරිභෝජන වියදම: රජයේ .. ., | 881 | 13·7 | 911 | 13·8 | 926 | 13·8 | 979 | 14·3 | 1,011 | 14·4 | 1,090 | 14·5 | 1,116 | 14·4 |
| 3. දළ-දේශීය ප්‍රාග්ධන සම්පාදනය: පෞද්ගලික අංශය රජයේ සමායතන: .. | 745 | 11·6 | 618 | 9·4 | 652 | 9·7 | 627 | 9·1 | 610 | 8·7 | 646 | 8·6 | 515 | 6·7 |
| 4. දළ-දේශීය ප්‍රාග්ධන සම්පාදනය: රජයේ ව්‍යාපාර .. } 5. දළ-දේශීය ප්‍රාග්ධන සම්පාදනය: .. .. රජයේ | 314 | 4·9 | 303 | 4·6 | 395 | 5·9 | 403 | 5·9 | 389 | 5·5 | 336 | 4·5 | 409 | 5·3 |
| 6. දළ-දේශීය වියදම් .. | 6,613 | 103·1 | 6,817 | 103·7 | 6,813 | 101·5 | 7,009 | 102·1 | 7,179 | 102·6 | 7,702 | 102·6 | 7,732 | 99.9 |
| 7. ජාතික නිෂ්පාදිතය (ගලපා) ✱ | 6,416 | 100·0 | 6,575 | 100·0 | 6,708 | 100·0 | 6,863 | 100·0 | 6,998 | 100·0 | 7,501 | 100·0 | 7,740 | 100·0 |
| 8. ශීර්ෂ (6) ශීර්ෂ (7) ට වැඩිකොටස ලැබුනේ- | | | | | | | | | | | | | | |
| (අ) පිටරට ආයෝජන (ශුද්ධ) අඩුකිරීමෙන් | +208 | | +221 | | + 94 | | +140 | | +168 | | +160 | | — 44 | |
| (ආ) ජාත්‍යන්තර, ත්‍යාග හා ප්‍රේෂණ ලැබීමෙන් (ශුද්ධ) .. .. | — 12 | | + 22 | | + 11 | | + 7 | | + 13 | | + 40 | | + 36 | |
| (අ) + (ආ) .. .. | +196 | | +243 | | +105 | | +147 | | +181 | | +200 | | — 8 | |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

✱ දළ ජාතික වියදම් පිළිබඳ සංඛ්‍යා සටහනින් (සංඛ්‍යා සටහන II (අ) (4) ගනු ලැබූ මේ සංඛ්‍යා සටහනේ දැක්වෙන අනෙකුත් ශීර්ෂ සමග ඒකාකාරිත්වයක් ඇති වනු සඳහා II (අ) 5 සංඛ්‍යා සටහනින් 3 වැනි ශීර්ෂය වශයෙන් දක්වා ඇති පවත්නා වෙළඳ මිළ අනුව වූ දළ ජාතික නිෂ්පාදිත වියදම් සංඛ්‍යා එම සටහනින් 13 වැනි ශීර්ෂය සමග ගලපා ඇත.

## සංඛ්‍යා සටහන II (අ) 10

## (දළ) ජාතික වියදම් සැකසුමේ අඩංගු ආනයන

| | 1959 | | | | 1960 | | | | 1961 | | | | 1962 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පෞද්ගලික පරිභෝජනය | රජයේ පරිභෝජනය | දළ දේශීය හා ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | තොග වෙනස්වීම | පෞද්ගලික පරිභෝජනය | රජයේ පරිභෝජනය | දළ දේශීය හා ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | තොග වෙනස්වීම | පෞද්ගලික පරිභෝජනය | රජයේ පරිභෝජනය | දළ දේශීය හා ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | තොග වෙනස්වීම | පෞද්ගලික පරිභෝජනය | රජයේ පරිභෝජනය | දළ දේශීය හා ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | තොග වෙනස්වීම |
| 1. වියදම (වෙළඳ මිල අනුව) (රු. දශ ලක්ෂ) .. | 4,673 | 881 | 1,069 | —10 | 4,985 | 911 | 966 | —45 | 4,840 | 926 | 978 | +69 | 4,999 | 979 | 1,031 | —1 |
| 2. ආනයන අඩංගුව (මි. ර. ගැ. මිල අනුව) | | | | | | | | | | | | | | | | |
| (අ) ප්‍රමාණය රු. දශ ලක්ෂ) | 1,426 | 82 | 365 | +13 | 1,365 | 120 | 336 | —26 | 1,166 | 65 | 306 | —12 | 1,104 | 52 | 310 | —2 |
| (ආ) සියයට ගණන .. | 30·5 | 9·3 | 34·1 | | 27·4 | 13·2 | 34·8 | | 24·1 | 7·0 | 31·3 | | 22·1 | 5·3 | 30·1 | |
| 3. ආනයන අඩංගුව-වෙළඳ මිල අනුව * | | | | | | | | | | | | | | | | |
| (අ) ප්‍රමාණය(රු. දශ ලක්ෂ) | 1,990 | 84 | 565 | +15 | 2,059 | 122 | 519 | —28 | 1,845 | 67 | 473 | —14 | 1,868 | 54 | 479 | —4 |
| (ආ) සියයට ගණන .. | 42·6 | 9·5 | 52·9 | | 41·3 | 13·4 | 53·7 | | 38·1 | 7·2 | 48·4 | | 37·4 | 5·5 | 46·5 | |

| | 1963 | | | | 1964 | | | | 1965 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පෞද්ගලික පරිභෝජනය | රජයේ පරිභෝජනය | දළ දේශීය හා ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | තොග වෙනස්වීම | පෞද්ගලික පරිභෝජනය | රජයේ පරිභෝජනය | දළ දේශීය හා ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | තොග වෙනස්වීම | පෞද්ගලික පරිභෝජනය | රජයේ පරිභෝජනය | දළ දේශීය හා ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | තොග වෙනස්වීම |
| 1. වියදම (වෙළඳ මිල අනුව) (රු. දශ ලක්ෂ) .. | 5,170 | 1,011 | 991 | +8 | 5,629 | 1,090 | 1,023 | —40 | 5,692 | 1,116 | 969 | —45 |
| 2. ආනයන අඩංගුව (මි. ර. ගැ. මිල අනුව) | | | | | | | | | | | | |
| (අ) ප්‍රමාණය රු. දශ ලක්ෂ) | 984 | 47 | 293 | ... | 1,432 | 43 | 295 | n.a. | 945 | 40 | 230 | n.a. |
| (ආ) සියයට ගණන .. | 19·0 | 4·6 | 29·6 | | 25·4 | 3·9 | 28·8 | | 16·6 | 3·6 | 23·7 | |
| 3. ආනයන අඩංගුව-වෙළඳ මිල අනුව * | | | | | | | | | | | | |
| (අ) ප්‍රමාණය(රු. දශ ලක්ෂ) | 1,676 | 49 | 466 | +2 | 1,861 | 45 | 486 | n.a. | 1,720 | 42 | 403 | n.a. |
| (ආ) සියයට ගණන .. | 32·4 | 4·8 | 47·0 | | 33·1 | 4·1 | 47·5 | | 30·2 | 3·8 | 41·6 | |

සංඛ්‍යා : ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

* රජයේ (රාජ්‍යාරක්ෂක) ආනයන සහ ආනයන තොග වෙනස්වීම් අගය කොට ඇත්තේ වි. ර. ගැ. මිල අනුවය. ආනයන කළ අනෙකුත් සෑම වෙළෙඳ භාණ්ඩයක්ම සිල්ලර මිලට අගය කොට ඇත.

සංඛ්‍යා සටහන II (අ) 11

## කාර්මික මූලයන් අනුව දළ දේශීය නිෂ්පාදිතය - පවත්නා සාධක වියදම් මිල අනුව

| කර්මාන්ත | 1959 රුපියල් ලක්ෂ | 1959 සියයට ගණන | 1960 රුපියල් ලක්ෂ | 1960 සියයට ගණන | 1961 රුපියල් ලක්ෂ | 1961 සියයට ගණන | 1962 රුපියල් ලක්ෂ | 1962 සියයට ගණන | 1963 රුපියල් ලක්ෂ | 1963 සියයට ගණන | 1964 රුපියල් ලක්ෂ | 1964 සියයට ගණන | 1965 රුපියල් ලක්ෂ | 1965 සියයට ගණන | වෙනසේ සියයට ගණන 1961න් 1960 ට | 1962න් 1961 ට | 1963න් 1962 ට | 1964න් 1963 ට | 1965න් 1964 ට |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| I. කෘෂිකර්මය, දැව ඇ වන ද්‍රව්‍ය, පශු සම්පත හා ධීවර කර්මාන්ත * .. .. | 2,763 | 47 | 2,872 | 47 | 2,857 | 46 | 2,907 | 45 | 2,983 | 44 | 3,112 | 44 | 3,062 | 41 | — 0·5 | + 1·7 | + 2·6 | + 4·3 | — 1·6 |
| II. පතල් හා ගල් කැඩීම .. .. | 11 | ... | 11 | ... | 11 | ... | 12 | ... | 11 | ... | 10 | ... | 12 | ... | — 4·5 | +10·3 | — 6·8 | — 6·4 | +18·4 |
| III. නිෂ්පාදනය (ගොඩනැගිලි උපකරණ අත්හැර) .. .. .. | 271 | 5 | 317 | 5 | 353 | 6 | 417 | 7 | 499 | 7 | 553 | 8 | 611 | 8 | +11·1 | +18·3 | +19·6 | +10·8 | +10·6 |
| IV. ගොඩනැංවීම (ගොඩනැංවීමේ උපකරණ ඇතුලත්ව) .. .. .. | 384 | 7 | 349 | 6 | 385 | 6 | 429 | 7 | 424 | 6 | 419 | 6 | 464 | 6 | +10·6 | +11·2 | — 1·2 | — 1·1 | +10·7 |
| V. ප්‍රවාහණය, ගබඩා කිරීම සහ පණිවුඩ හුවමාරුව .. | 471 | 8 | 512 | 8 | 498 | 8 | 523 | 8 | 545 | 8 | 610 | 9 | 669 | 9 | — 2·9 | + 5·1 | + 4·1 | +11·9 | + 9·8 |
| VI. තොග සහ සිල්ලර වෙළෙඳාම .. .. | 647 | 11 | 647 | 11 | 624 | 10 | 662 | 10 | 719 | 11 | 768 | 11 | 851 | 12 | — 3·6 | + 6·1 | + 8·5 | + 6·9 | +10·7 |
| VII. බැංකු, රක්ෂණ හා අනෙකුත් මූල්‍ය .. | 48 | 1 | 52 | 1 | 56 | 1 | 59 | 1 | 68 | 1 | 71 | 1 | 74 | 1 | + 7·7 | + 5·7 | + 5·6 | + 4·0 | + 3·9 |
| VIII. නිවාස අයිතිය .. .. | 169 | 3 | 178 | 3 | 196 | 3 | 205 | 3 | 223 | 3 | 238 | 3 | 254 | 3 | + 9·9 | + 4·5 | + 8·9 | + 6·6 | + 6·6 |
| IX. රාජ්‍ය පාලනය හා ආරක්ෂාව .. .. | 397 | 7 | 402 | 7 | 403 | 7 | 444 | 7 | 469 | 7 | 493 | 7 | 501 | 7 | + 0·2 | +10·2 | + 5·5 | + 5·3 | + 1·5 |
| X. සේවා: අන්තැනෙක නොසඳහන් | | | | | | | | | | | | | | | | | | | |
| (අ) රජයේ, වෛද්‍ය, සෞඛ්‍ය, අධ්‍යාපන, ගුවන් විදුලි සහ ආකාශ වස්තු පිරික්සුම සේවා .. .. .. | 296 | 5 | 343 | 6 | 347 | 6 | 338 | 5 | 342 | 5 | 366 | 5 | 391 | 5 | + 1·1 | — 2·3 | + 1·2 | + 6·8 | + 6·8 |
| (ආ) අනෙකුත් සියලුම සේවා .. | 435 | 7 | 441 | 7 | 453 | 7 | 468 | 7 | 484 | 7 | 500 | 7 | 516 | 7 | + 2·6 | + 3·3 | + 3·5 | + 3·2 | + 3·3 |
| එකතුව .. .. | 731 | 13 | 784 | 13 | 799 | 13 | 806 | 13 | 826 | 12 | 865 | 12 | 907 | 12 | + 1·9 | + 0·9 | + 2·5 | + 4·7 | + 4·8 |
| **දළ - දේශීය නිෂ්පාදිතය** .. | 5,891 | 100 | 6,124 | 100 | 6,182 | 100 | 6,464 | 100 | 6,769 | 100 | 7,140 | 100 | 7,404 | 100 | + 0·9 | + 4·6 | + 4·7 | + 5·5 | + 3·7 |

* කෘෂිකාර්මික අපනයන පිළිවෙල කිරීම ද ඇතුළත් වෙයි.

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

මෑත අතීතයේදී පවත්නා නිෂ්පාදන මාර්ගයෙන් ලබාගත හැකි සම්පත් මාර්ග දළ දේශීය වියදම පියවා ගැනීමට තරම් ප්‍රමාණවත් නොවූ හෙයින් රටේ විදේශීය සංචිත වලින් මුදල් ලබාගැනීමට හෝ විදේශීය වගකීම් වැඩි කිරීමට හෝ සිදු විය. එහෙත් 1965දී පවත්නා නිෂ්පාදන වලින් ලබාගත හැකි සම්පත් මාර්ග දළ දේශීය වියදම ඉක්මවා ගියේය. මෙම වෙනස්වීම් II (අ) 9 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. 1959 සිට 1964 දක්වා දළ දේශීය වියදම, දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 101.5 සහ සියයට 103.7 අතර වෙනස් වෙමින් පැවතුන අතර දළ දේශීය විදයම සියයට 99.9 ක් පමණක් වූ බැව් එම සංඛ්‍යා සටහනින් පෙනී යයි.

රජයේ පරිභෝජනයෙහි, පෞද්ගලික පරිභෝජනයෙහි හා ප්‍රාග්ධන සම්පාදන යෙහි අඩංගු ආනයන ප්‍රමාණය II (අ) 10 සංඛ්‍යා සටහනෙහි දක්වෙයි. 1965 දී පාරිභෝගික භාණ්ඩ ආනයනය සැලකිය යුතු අන්දමින් පහළ වැටීම නිසා පෞද්ගලික පරිභෝජනයෙහි අඩංගු ආනයනවල වටිනාකම මි.ර.ගැ. මිල අනුව සියයට 25.4 සිට සියයට 16.6 දක්වා ද, වෙළෙඳ මිල අනුව සියයට 33.1 සිට සියයට 30.2 දක්වා ද අඩුවිය. තවද, ප්‍රාග්ධන භාණ්ඩ ආනයනයෙහි ඇති වූ පහළ වැටීම හේතුකොටගෙන ප්‍රාග්ධන සම්පාදනයෙහි අඩංගු ආනයන වටිනාකම මි.ර.ගැ. මිල අනුව සියයට 28.8 සිට සියයට 23.7 දක්වා ද, වෙළෙඳ මිල අනුව සියයට 47.5 සිට සියයට 41.6 දක්වාද පහළ වැටිණි. මේ හැර, විශේෂයෙන්ම සිමෙන්ති නිෂ්පාදිත හා සමහර ලෝහ නිෂ්පාදිත ඇතුළු දේශීය ප්‍රාග්ධන භාණ්ඩ නිෂ්පාදනය වැඩිවීම ද ප්‍රාග්ධන සම්පාදනයෙහි අඩංගු ආනයන ප්‍රමාණය පහළ වැටීම කෙරෙහි හේතු විය.

### කාර්මික මූල අනුව දළ දේශීය නිෂ්පාදිතය

කාර්මික මූලයන් අනුව දළ දේශීය නිෂ්පාදිතය II (අ) 11 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. 1965 දී පොල් සහ වී නිෂ්පාදනය හීනවීම නිසා "කෘෂිකර්මය, දඩ ඇ වන ද්‍රව්‍ය සහ ධීවර කර්මාන්තය" යන ගණයෙන් දළ දේශීය නිෂ්පාදිතයට ලැබෙන කොටස 1964 සංඛ්‍යාව වූ සියයට 44 සිට සියයට 41 දක්වා පහළ වැටිණි. 1959 දී සියයට 5 සිට 1964 දී සියයට 8 දක්වා නොකඩවා වැඩි වූ නිෂ්පාදනවල සාපේක්ෂක වැදගත්කම 1965 දී නොවෙනස්ව පැවතිණි. එසේ වුවද, අනෙකුත් සියළුම භාණ්ඩ හා සේවා කොටස 1964 සංඛ්‍යාව වූ සියයට 48 සිට 1965 දී සියයට 51 දක්වා ඉහළ ගියේය.

### මූර්ත නිෂ්පාදිතය, මූර්ත ආදායම හා මූර්ත වියදම

ස්ථාවර මිල අනුව දළ ජාතික නිෂ්පාදිතය පිළිබඳ ඇස්තමේන්තු II (අ) 12 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. 1964 දී ස්ථාවර මිල අනුව දළ ජාතික නිෂ්පාදිතය සියයට 4.4 කින් ඉහළ ගිය නමුදු 1965 දී එය වැඩිවූයේ සියයට 2.0 කින් පමණි. ඉකුත් වර්ෂයේදී සියයට 8.7 කින් වැඩිවූ අපනයනවල මූර්ත වටිනාකම 1965 දී වැඩි වූයේ සියයට 2.1 කින් පමණි. ස්ථාවර මිල අනුව කැරුන ඇස්තමේන්තු වලින් පිළිබිඹු වූ පරිදි, තේ සහ රබර් අපනයන ප්‍රමාණය පිළිවෙලින් සියයට 8.7 කින් හා සියයට 5.4 කින් වැඩි වූ නමුදු ප්‍රධාන පොල් නිෂ්පාදිත තුන් වර්ගයෙහි අපනයන ප්‍රමාණය තියුණු ලෙස සියයට 21.6 කින් අඩු වූයේය. පහළ වැටුනේ යැයි ඇස්තමේන්තු කර ඇති අපනයන තොගවල වෙනස්වීම්ද ගණනට ගත් කල අපනයන අංශයේ ශුද්ධ නිමැවුමෙහි මූර්ත වටිනාකම සියයට 0.8 කින් පහළ වැටී ඇත.

සංඛ්‍යා සටහන II/ (අ) 12.

## දළ ජාතික නිෂ්පාදිතය - 1959 ස්ථාවර සාධක වියදම් මිල අනුව

| | 1959 පැවති වටිනාකම රුපියල් දශ ලක්ෂ | | | | | | | වෙනසේ සියයට ගණන | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1965 | 1962න් 1961 ට | 1963න් 1962 ට | 1964න් 1963 ට | 1965න් 1964 ට |
| **I. අපනයන සඳහා නිෂ්පාදනය:** | | | | | | | | | | | |
| (i) දේශීය අපනයන– නැ.වි. ස. වටිනාකම.. | 1,692 | 1,766 | 1,841 | 1,974 | 1,896 | 2,062 | 2,105 | + 7·2 | — 4·0 | + 8·7 | + 2·1 |
| තොග වෙනස්වීමේ වටිනාකම .. | — 2 | — 37 | + 17 | — 37 | + 6 | — 41 | — 85 | | | | |
| පාවිච්චි කළ ආනයන භාණ්ඩ හැර (වෙළෙඳ මිල අනුව) | —124 | —120 | —133 | —157 | —169 | —178 | —186 | | | | |
| අපනයන භාණ්ඩ බෙදා හැරීමේ වියදම් හැර .. | —104 | —108 | —110 | —118 | —115 | —121 | —127 | | | | |
| නිපැයුම–ශුද්ධ .. | 1,462 | 1,501 | 1,615 | 1,663 | 1,618 | 1.722 | 1,708 | + 3·0 | — 2·7 | + 6·4 | — 0·8 |
| (ii) ප්‍රති අපනයන: එකතු කල වටිනාකම .. | 3 | 2 | 2 | 2 | 1 | 1 | 1 | | | | |
| **අපනයන සඳහා කැරුන මුළු නිෂ්පාදන:නිපැයුම - ශුද්ධ** | **1,465** | **1,503** | **1,617** | **1,665** | **1,619** | **1,723** | **1,709** | **+ 3·0** | **— 2·8** | **+ 6·4** | **— 0·8** |
| **II. දේශීය පාවිච්චිය සඳහා කැරුන නිෂ්පාදනය නිපැයුම-ශුද්ධ** | | | | | | | | | | | |
| (i) වී, තේ සහ පොල් නිෂ්පාදිත .. | 642 | 723 | 731 | 788 | 844 | 866 | 700 | + 7·9 | + 7·0 | + 2·6 | —19·2 |
| (ii) රජයේ අන්තැනෙක නොසඳහන් .. | 702 | 755 | 759 | 792 | 821 | 869 | 902 | + 4·3 | + 3·7 | + 5·9 | + 3·7 |
| (ii) අනෙකුත් භාණ්ඩ හා සේවා .. | 3,082 | 3,129 | 3,173 | 3,277 | 3,367 | 3,464 | 3,728 | + 3·3 | + 2·7 | + 2·9 | + 7·6 |
| **එකතුව** .. | **4,426** | **4,607** | **4,663** | **4,857** | **5,031** | **5,199** | **5,330** | + 4·2 | + 3·6 | + 3·3 | + **2·5** |
| **III. දළ දේශීය නිෂ්පාදිතය** .. | **5,891** | **6,110** | **6,2€0** | **6,522** | **6,650** | **6,922** | **7,038** | + 3·9 | + 2·0 | + 4·1 | + 1·7 |
| **IV. පිටරටින් ලැබුන සාධක ආදායම–ශුද්ධ** .. | **— 37** | **— 44** | **— 40** | **— 50** | **— 51** | **— 34** | **— 14** | | | | |
| **V. දළ ජාතික නිෂ්පාදිතය** .. | **5,854** | **6,066** | **6.240** | **6,472** | **6,599** | **6,888** | **7,024** | + 3·7 | + 2·0 | + 4·4 | + 2·0 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

වී අස්වැන්න පාළුවීම හේතුකොටගෙන දේශීය අංශයේ ‘වී, තේ, සහ පොල්’’ ගණයෙහි මූර්ත නිමැවුම සියයට 19.2 කින් පහළ වැටුනේය. රජයේ ශුද්ධ නිමැවුම සියයට 3.7 කින් ඉහළ ගිය අතර අනෙකුත් භාණ්ඩ හා සේවාවන්හි ශුද්ධ නිමැවුම සියයට 7.6 කින් ඉහළ ගියේය. 1965 දී දළ දේශීය නිෂ්පාදිතය සියයට 1.7 කින් වැඩි විය. 1965 දී ආයෝජන ආදායම ඇදීයාම ඉකුත් වර්ෂයේදීට වඩා අඩු විය. ආයෝජන ආදායමද ඇතුළු මුළු දළ දළ ජාතික නිෂ්පාදිතය සියයට 2.0 කින් වැඩි විය. 1965 දී ලංකාවේ ජනගහනය සියයට 2.4 කින් වැඩි වී ඇතැයි

ඇස්තමේන්තුකර ඇත. මේ අනුව බලන කල, මූර්ත නිෂ්පාදිතය වැඩිවූයේ සියයට 2.0 කින් පමණක් බැවින් ඒක ජන මූර්ත නිෂ්පාදිතය සියයට 0.4 කින් පහළ වැටී ඇත.

සංඛ්‍යා සටහන II (අ) 13

**මූර්ත ජාතික ආදයම සහ වියදම**

| | රුපියල් දශ ලක්ෂ | | | | | | | වෙනසේ සියයට ගණන | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1965 | 1962න් 1961 ට | 1963න් 1962 ට | 1964න් 1963 ට | 1965න් 1964 ට |
| දළ ජාතික නිෂ්පාදිතය 1959 ස්ථාවර සාධක වියදම් මිල අනුව .. | 5,854 | 6,066 | 6,240 | 6,472 | 6,599 | 6,888 | 7,024 | + 3.7 | + 2.0 | + 4.4 | + 2.0 |
| 2. පහත සඳහන් අපනයන නිසා වෙළෙඳ අනුපාතයේ බලපෑම් | | | | | | | | | | | |
| (i) තේ .. .. | | — 32 | — 37 | + 1 | —134 | —156 | —212 | | | | |
| (ii) රබර් .. .. | | + 37 | — 25 | — 13 | — 56 | — 94 | —104 | | | | |
| (iii) තෙවැදෑරුම් ප්‍රධාන පොල් නිෂ්පාදිත .. | | — 26 | — 90 | — 80 | — 63 | — 84 | — 12 | | | | |
| (iv) අනෙකුත් නිෂ්පාදිත .. | | + 10 | + 1 | + 10 | + 11 | + 18 | + 18 | | | | |
| (v) සියළුම නිෂ්පාදිත | | — 11 | —151 | — 82 | —242 | —316 | —309 | | | | |
| 3. දළ-ජාතික ආදයම 1959 ස්ථාවර සාධක වියදම් මිල අනුව .. | 5,854 | 6,055 | 6,089 | 6,390 | 6,357 | 6,572 | 6,715 | + 4.9 | — 0.5 | + 3.4 | + 2.2 |
| 4. ආධාර හැර අනියම් බදු (ගලපා) | 389 | 403 | 405 | 425 | 356 | 437 | 446 | | | | |
| 5. දළ-ජාතික වියදම් 1959 ස්ථාවර වෙළෙඳ මිල අනුව . | 6,244 | 6,458 | 6,494 | 6,815 | 6,714 | 7,009 | 7,161 | + 5.0 | — 1.5 | + 4.4 | + 2.2 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

සංලක්ෂය: 1960 සිට 1964 දක්වා සංඛ්‍යාවන් ප්‍රතිශෝධනය කරන ලදී.

මූර්ත නිෂ්පාදිතය කෙරෙහි වෙළෙඳ අනුපාතයේ බලපෑම ඇතුල්වනසේ ගලපන ලද' මූර්ත ජාතික ආදයම් ඇස්තමේන්තු II (අ) 13 සංඛ්‍යා සටහනින් දැක්වෙයි. 1964 දී සියයට 2.6 කින් පිරිහුන වෙළෙඳ අනුපාතය, 1965 දී සියයට 1.2 කින් වර්ධනය විය. එහෙයින් 1964 දී 316 ක් වූ වෙළෙඳ අනුපාතයේ බලපෑම 1965 දී 309 දක්වා වර්ධනය විය. 1965 දී මූර්ත නිෂ්පාදිතය සියයට 2.0 කින් වැඩිවූ අතර මූර්ත ජාතික ආදයම සියයට 2.2 කින් ඉහළ ගියේය.

**නිෂ්පාදනය හා අපනයනය**

ප්‍රධාන කෘෂිකාර්මික වගාවන්හි නිෂ්පාදනය II (අ) 14 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. 1964 දී සුළු වශයෙන් පිරිහුන තේ නිෂ්පාදනයෙහි 1965 දී වැඩිවීමෙක් දක්නට ලැබිණි. රබර් නිෂ්පාදනයද වැඩි වූ නමුදු එය ඉකුත් වර්ෂයේ වර්ධන ප්‍රවේගයට වඩා තරමක් අඩු විය. තේ සහ රබර් යන වගාවන් දෙකෙහිම නිමැවුම වැඩිවූයේ ඵල දැරීම ඇරඹුන නැවත වගාකළ බිම් ප්‍රමාණය වැඩිවීම හේතු කොට ගෙනය. අනෙක් අතට, අහිතකර කාලගුණ තත්ත්වය හේතු කොටගෙන පොල් හා වී නිෂ්පාදනය සැළකිය යුතු ප්‍රමාණයකින් අඩුවිය.

සංඛ්‍යා සටහන II (අ) 14

**ප්‍රධාන කෘෂිකාර්මික බෝග නිෂ්පාදන ප්‍රමාණය**

| | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1965 | සියයට ගණන 1961න් 1960 ට | 1962න් 1961 ට | 1963න් 1962 ට | 1964න් 1963 ට | 1965න් 1964 ට |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| තේ (රාත්තල් දශ ලක්ෂ) .. | 413 | 435 | 455 | 467 | 485 | 482 | 503 | + 4·6 | + 2·6 | + 3·9 | — 0·6 | + 4·4 |
| රබර (රාත්තල් දශ ලක්ෂ) .. | 205 | 218 | 215 | 229 | 231 | 246 | 261 | — 1·4 | + 6·5 | + 0·9 | + 6·5 | + 6·1 |
| පොල් නිෂ්පාදන * (ගෙඩි දශ ලක්ෂ ගණනින්) .. | 2,313 | 2,183 | 2,601 | 2,811 | 2,557 | 3,000† | 2,681 | +19·1 | + 8·1 | — 9·0 | +17·3 | —10·6 |
| වී (බුසල් දශ ලක්ෂ) | 36·5 | 43·1 | 43·2 | 48·1 | 49·2 | 50·5 | 35·6 | + 0·2 | +11·3 | + 2·3 | +2·6 | —29·5 |

* කොප්පරා, කපාපු පොල්, පොල් තෙල් සහ ගෙඩි පොල්.

සංඛ්‍යා: තේ පාලකගේ පාලන වාර්තාව;
රබර් පාලකගේ පාලන වාර්තාව;
සංගණන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව;
ශ්‍රී ලංකා මහ බැංකුව

## තේ

1964 අවසානයේදී අක්කර 5, 91, 999 ක් වූ තේ වගාව 1965 දී අක්කර 5, 94, 298 දක්වා වැඩි විය. 1965 දී තේ නිෂ්පාදනය 1964 සංඛ්‍යාව වූ රාත්තල් කෝටි 48.2 සිට රාත්තල් කෝටි 50.3 දක්වා රාත්තල් කෝටි 2.1 කින් හෙවත් සියයට 4 4 කින් වැඩි විය. මෙම වැඩිවීම කෙරෙහි හේතු වූයේ, විද්‍යාත්මක ලෙස පොහොර යෙදීම, යහපත් කාලගුණ තත්ත්වය සහ දළු නෙලීම සඳහා සුදුසු තත්ත්වයට එළඹුන නැවත වගා කරන ලද ඉඩම් ප්‍රමාණය වැඩිවීමය. තේ අක්කරයක සාමාන්‍ය එලදුව 1964 සංඛ්‍යාව වූ රාත්තල් 814 සිට 1965 දී රාත්තල් 848 දක්වා වැඩිවිය.

1964 දී රාත්තල් කෝටි 45.6 ක් වූ තේ අපනයන පරිමාව 1965 දී රාත්තල් කෝටි 49.5 දක්වා වැඩි විය. තේ අපනයනවල වටිනාකම රුපියල් කෝටි 114.2 සිට රුපියල් 121.0 දක්වා ඉහළ ගියේය.

## රබර්

1965 අවසාන වන විට වගාකර තිබූ රබර් ඉඩම් ප්‍රමාණය අක්කර 6,71,487 ක් විය. එයින් අක්කර 2,29,335 ක් හෙවත් සියයට 34 ක් නැවත වගාකිරීමේ ආධාර ක්‍රමය යටතේ නැවත වගා කරන ලද රබර් ඉඩම් විය. 1965 දී මෙම ක්‍රමය යටතේ නැවත වගා කරන ලද රබර් අක්කර ගණන 12,501 ක් විය. ඉකුත් වර්ෂය තුළදී නැවත වගා කරන ලද ප්‍රමාණය අක්කර 13,553 ක් විය.

1964 දී රාත්තල් කෝටි 24·6 ක්වූ රබර් නිෂ්පාදනය 1965 දී රාත්තල් කෝටි 26·1 දක්වා රාත්තල් කෝටි 1·5 හෙවත් සියයට 6·1 කින් වැඩිවිය. 1965 දී රබර් නිෂ්පාදනය වැඩි වූයේ කිරි කැපීමට සුදුසු තත්ත්වයට පත්වූ නැවත වගා කරන

## සංඛ්‍යා සටහන II (අ) 15

## අපනයන වටිනාකම-නෑ. වි. ස.

| | පවත්නා මිල | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රුපියල් දශ ලක්ෂ | | | | | | | වෙනසේ සියයට ගණන | | | |
| | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1965 | 1962න් 1961 ට | 1963න් 1962 ට | 1964න් 1963 ට | 1965න් 1964 ට |
| **දේශීය අපනයන** | | | | | | | | | | | |
| තේ .. .. | 1,046 | 1,097 | 1,115 | 1,149 | 1,141 | 1,142 | 1,210 | + 3.1 | — 0.7 | + 0.1 | + 6.0 |
| රබර් .. .. | 298 | 378 | 260 | 290 | 257 | 290 | 304 | +11.6 | —11.5 | +12.9 | + 4.9 |
| පොල් සහ තෙවැදෑරුම් ප්‍රධාන පොල් නිෂ්පාදන * .. | 244 | 184 | 202 | 228 | 198 | 274 | 275 | +12.6 | —12.9 | +37.9 | + 0.6 |
| අනෙකුත් .. .. | 105 | 116 | 104 | 99 | 109 | 137 | 127 | — 4.1 | + 9.6 | +25.5 | — 7.2 |
| එකතුව .. | 1,692 | 1,775 | 1,681 | 1,766 | 1,705 | 1,842 | 1,916 | + 5.1 | — 3.5 | + 8.1 | + 4.0 |
| **ප්‍රති අපනයන එකතුව** .. | 62 | 57 | 52 | 42 | 26 | 34 | 33 | —18.9 | —38.2 | +30.8 | — 4.6 |

| | 1959 ස්ථාවර මිල | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රුපියල් දශ ලක්ෂ | | | | | | | වෙනසේ සියයට ගණන | | | |
| | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1965 | 1962න් 1961 ට | 1963න් 1962 ට | 1964න් 1963 ට | 1965න් 1964 ට |
| **දේශීය අපනයන** | | | | | | | | | | | |
| තේ .. .. | 1,046 | 1,116 | 1,159 | 1,230 | 1,241 | 1,240 | 1,348 | + 6.1 | + 0.9 | — 0.1 | + 8.7 |
| රබර් .. .. | 298 | 337 | 286 | 324 | 305 | 368 | 388 | +13.5 | — 5.9 | +20.7 | + 5.4 |
| පොල් සහ තෙවැදෑරුම් ප්‍රධාන පොල් නිෂ්පාදන * .. | 244 | 208 | 294 | 324 | 256 | 343 | 269 | +10.2 | —21.0 | +34.4 | —21.6 |
| අනෙකුත් .. .. | 105 | 105 | 103 | 97 | 95 | 111 | 100 | — 5.8 | — 2.1 | +17.0 | — 9.8 |
| එකතුව .. | 1,692 | 1,766 | 1,841 | 1,974 | 1,896 | 2,062 | 2,105 | + 7.2 | — 4.0 | + 8.7 | + 2.1 |
| **ප්‍රති අපනයන එකතුව** .. | 62 | 58 | 57 | 49 | 29 | 38 | 40 | —15.0 | —39.9 | +31.0 | + 0.5 |

* කොප්පරා, පොල්තෙල් සහ කපාපු පොල්

සංඛ්‍යා: ලංකා රේගු වාර්තා;
ශ්‍රී ලංකා මහ බැංකුව.

ලද ඉඩම් ප්‍රමාණය වැඩිවීම හේතු කොටගෙනය. රබර් අක්කරයක සාමාන්‍ය එලදාව 1964 සංඛ්‍යාව වූ රාත්තල් 450 සිට 1965 දී රාත්තල් 468 (තාවකාලික) දක්වා වැඩිවිය.

1964 දී රාත්තල් කෝටි 25·3 ක්වූ රබර් අපනයන පරිමාව 1965 දී රාත්තල් කෝටි 26·7 දක්වා වැඩි වූයේ සියයට 5·4 ක වැඩිවීමක් පිළිඹිබු කරමිනි. 1964 දී එහි වැඩිවීම සියයට 20·9 ක් වූයේය. එසේ වුවද, රබර් රාත්තලක නැ.වි.ස. මිල 1964 දී රුපියල් 1·15 සිට 1965 දී රුපියල් 1·14 දක්වා සුළු වශයෙන් පහළ වැටුන බැවින් රබර් අපනයන වටිනාකම ඉහළ ගියේ සියයට 4·9 ක් පමණි.

**පොල්**

රට තුළ ප්‍රයෝජනයට ගත් හා අපනයනය කරන ලද පොල් ගෙඩි ප්‍රමාණය අනුව සැකසූ ඇස්තමේන්තු අනුව, 1965 පොල් නිෂ්පාදනය 1964 සංඛ්‍යාව වූ ගෙඩි කෝටි 300·0 සිට ගෙඩි කෝටි 268·1 දක්වා සියයට 10·6 කින් පහළ වැටී ඇත. 1965 දී පොල් අපනයනය (උපයෝගී කරගත් ගෙඩි ප්‍රමාණය අනුව) 1964 සංඛ්‍යාව වූ ගෙඩි කෝටි 162·6 සිට ගෙඩි කෝටි 127·4 දක්වා සියයට 21·6 කින් පහළ වැටුනේය. පොල් නිෂ්පාදනය අඩුවූයේ අහිතකර කාලගුණ තත්ත්වය හේතු කොටගෙනය.

**වී**

1965 දී අයහපත් කාලගුණ තත්ත්වය යල සහ මහ දෙකෙහිම වී වගාව කෙරෙහි දරුණු ලෙස බලපැවැත්වීම හේතු කොටගෙන වී නිෂ්පාදනය තියුණු ලෙස පහළ වැටුනේය. ඉකුත් මහ කන්නයේ දී බුසල් කෝටි 3·21 ක්වූ වී නිපැයුම මෙම මහ කන්නයේදී බුසල් කෝටි 2·31 දක්වා අඩුවිය. සංගණන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ තාවකාලික ඇස්තමේන්තු අනුව යල කන්නයේ අස්වැන්න බුසල් කෝටි 1·25 ක් පමණි. ඉකුත් යල කන්නයේ අස්වැන්න බුසල් කෝටි 1·84 ක් වූයේය. මේ අනුව කන්න දෙකේම මුළු වී නිෂ්පාදනය 1964 දී ඇතිවූ සියයට 2·6 ක වැඩිවීමක් සමග සසඳා බලන කල, 1965 වී නිෂ්පාදනය සියයට 29 5 කින් අඩු වී ඇත. 1964 දී බුසල් 38·8 ක්වූ අක්කරයක සාමාන්‍ය අස්වැන්න 1965 දී බුසල් 33·0 දක්වා අඩු විය.

වී නිෂ්පාදනයෙන් ලැබුන සහල් ප්‍රමාණය 1964 දී ටොන් 7,05,200 ක්වූ අතර, එය 1965 දී ටොන් 4,97,100 ක් වූයේය. 1964 දී ටොන් 5,47,000 ක්වූ සහල් ආනයනය 1965 දී ටොන් 6,42,000 දක්වා වැඩිවිය. සහතික මිල ක්‍රමය යටතේ මිලට ගත් වී ප්‍රමාණය 1964 දී බුසල් කෝටි 2·98 ක්වූ අතර, 1965 දී එය බුසල් කෝටි 2·13 දක්වා අඩුවීමෙන් සහල් නිෂ්පාදනයේ පහළ වැටීම පිළිබිඹු විය. 1964 දී මුළු සහල් පරිභෝජන ප්‍රමාණය (ප්‍රතිශෝධිත සංඛ්‍යාව) වන ටොන් 11,45,400* සමග සසඳා බලන කල 1965 සඳහා තාවකාලිකව ඇස්තමේන්තු කර ඇති ප්‍රමාණය ටොන් 11,20,400* කි.

---

* මෙම ඇස්තමේන්තුව, ආහාර දෙපාර්තමේන්තුව විසින් සමුපකාර වෙළෙඳ සැල් හා ලියාපදිංචි වෙළෙඳුන් මාර්ගයෙන් පරිභෝජනය සඳහා නියම වශයෙන් නිකුත් කරන ලද සහල් ප්‍රමාණය පදනම් කොට සකසා ඇති බැවින් 22 වැනි පිටුවේ අධෝ ලිපියෙහි විස්තර කර ඇති පරිදි මෙම සංඛ්‍යා නියම සංඛ්‍යා වලට වැඩිවිය හැකිය. එබැවින් සහල් පරිභෝජනය පිළිබඳ නියම සංඛ්‍යාව ඉහතකී සංඛ්‍යාවට වඩා අඩුවිය හැකිය-